## 2020 දෙසැම්බර් මස 22 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

## විශේෂ සභා රැස්වීම් වාර් තාව

**සහභාගීත්වය**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ර්.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්. සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

❖ **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**01** සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම **නැත.**

**02** සංශෝධන නැත

03 ලැබී ඇති ලිපි හා පෙත්සම් නැත

04 යථා පරිදි කල් දී පශ්න නැත

05 යථා පරිදි කල් දි යෝජනා

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රථමයෙන් මා ඉල්ලා සිටිනවා අයවැයට ප්‍රථම 05.01.02 යටතේ ක්‍රියාකාරි සැලැස්ම අනුමත කිරිම සහ 05.01.03 යටතේ පොත් ලබා දීම සම්බන්ධ යෝජනාව යන යෝජනා දෙකක් තිබෙනවා . ඒ දෙක අනුමත කිරිමට ප්‍රථමයෙන් සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**05.01.02 2021 වර් ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුමත කිරිම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2021ක්‍රියාකාරි සැලැස්ම මා යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ස්ථිර කරනවා එම යෝජනාව.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අනුමතයි

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මා විරුද්ධයි. විරුද්ධත්වය ප්‍රකාශ කරන්නේ මේකේ Community Development Assistant

කියල තනතුරක් දාල තියෙනවා. ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මොකක්ද?

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

Community Development Assistant කියල ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර. ඒක කාඩර් එකේ දාල නැහැ.නැති තනතුරකට

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කීවෙනි පිටුවද?

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

පිටු අංක 03. සීරියල් නම්බර් එක 07.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හත

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේකෙ තියෙනවා කාඩර් එකේ නැහැ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පිටු අංක හතේ තියෙන්නේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

තුන පිටුවේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හා තුනේ හත. පොඩ්ඩක් ඉන්න. හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

තුනේ හත. ඒක කාඩර් එකේ නැහැ. ඒකට දැන් සේවක පිරිසේ එක්කෙනෙක් යොදවලා තියෙනවා. ඉතින් මේකෙ නැති එහෙකට ඇයි මේ සම්බන්ධ කිරිම ගැන අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය ඒකට උත්තර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒකත් එක්ක තව තියෙනවා අංක 15. තාක්ෂණ නිලධාරී. Information Technology කියල කාඩර් එකත් නැහැ. ඒ දෙක

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොහොද? අනිත් එක මොකක්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පිටු අංක තුනේ එකේ 15

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි. තවත් තියෙනවද? මේක සම්පූර්ණයෙන්ම නිලධාරීන් විසින් හදන ලද වාර්තාවක්. මගේ වාර්තාවක් නෙමේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒ දෙකේ අනුයුක්තව සම්බන්ධව තියෙන ලිපිගොනු ඉදිරිපත් කරන්නකො සභාවට. ලේකම්තුමියත් එක්ක නෙමේ කතා කරන්නේ ගරු සභාපතිතුමත් එක්ක.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. ඔබතුමාට ලේකම්තුමිය හම්බවෙලා ලිපිගොනුව බලන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ දැන් ඉදිරිපත් කරන්න. මොකද මේකට අපි විරුද්ධ නිසා. තව විනාඩි 10 කින් දෙන්න. අපි සභාව කරගෙන යන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි.ඉවර කරන්න. මේක අරුණ ප්‍රදීප් හදපු එකක් නෙමේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මං කියන්නෙ ගරු සභාපතිතතුමා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ. ඒකෙ කිසි ගැටලුවක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නිවැරදි කරගන්න ඕනනෙ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් ඔව් නිවැරදි කරගන්න ඕනනෙ. ප්‍රධාන කළමනාකාර මහත්මිය . හරි. ඒ දෙක විතරද ප්‍රශ්නෙකට තියෙන්නෙ. ඒ දෙකට උත්තරේ ලැබේවි. ඒ දෙකට යටත්ව අපි අනුමත කරනව එහෙනම් මේක. හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා   මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මං හිතන්නෙ මේ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව සාකච්ඡා කරන්න අපට ඉතාමත්ම කෙටි දිනකින් තමයි මේක ලැබුණ. ඒක නිසා මේක සම්පූර්ණයෙන් පරිශීලනය කිරීමේ අවස්ථාවක් අපට ලැබිල නැහැ. මේකෙ උඩින් පල්ලෙන් අපට කතා කරන්නත් බැහැ. යම් යම් අඩුපාඩු ඇති. ඒවට යටත්ව තමයි අපි මේ අනුමැතිය ලබාදෙන්නෙ. මොකද මේක අපට පරිශීලනය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලැබුණෙ නැති නිසා. වෙන ගැටලුවක් නැහැ ගරු සභාපතිතුමනි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ක්‍රියාකාරී සැලැස්මේ ඕනම දෙයක් අපට වෙනස් කරගන්න පුළුවන්. මේකට ප්‍රධාන වශයෙන්ම කෝ මේ විෂය කරන ළමයා. ඔයා ඉදිරිපත් කිරීමට හේතුවෙච්ච කරුණු සභාවට කියන්න. මෙකෙ යම් සංශෝධන තියෙනවනම් ඊලඟ සභාවට ඉදිරිපත් කරන්න. සංශෝධන ඇතුළත් කිරීමේ කාර්යභාරය තියෙනවා. ඒ අනුව ඕක ඉදිරිපත් කරන්න. දැනට අපි විගණන සහ නගර සභා අතර තියෙන තරඟාවලිවලදී මෙවැනි සැලැස්මක් අනුමත කරල තියෙන්න ඕන ඒ පෙර වර්ෂයට ඉස්සෙල්ලා. ඒක නිසා තමයි මේක අනුමත කිරීම ප්‍රධාන වශයෙන්ම කරන්නෙ. ඊට පස්සෙ අපි අපේ වැඩකටයුතුවල යම්කිසි අනිවාර්යයෙන්ම නිශ්චිත අයුරින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව දැක්වෙන වැඩසටහනක් තමයි ඔය ක්‍රියාකාරී සැලැස්මෙන් ඉදිරිපත් කරන්නෙ. ඒ අනුව තමයි අපි අනුමත කිරීම කරන්නෙ. අපි මේක අනුමත කරනවා. සභාවෙ ගරු මන්ත්‍රීවරු ඕන එක්කෙනෙකුට ලබන ජනවාරි මාසයේ පළමුවෙනි සභාවේ මේකෙ අවශ්‍යතාවයක් තියෙනවානම් ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගිය වර්ෂයෙදිත් මේ ගැන අපිට දීර්ස ලෙස සාකච්ජා කරන්න සිද්ධ වුණා. මං හිතන්නෙ වෙනමම රැස්වීමක් කැඳවලා අපි ගිය වසරෙදි මේක සාකච්ජා කළා. මටත් හිතෙන්නෙ ගරු සරත් මන්ත්‍රීතුමා කිව්ව වගේ මේකට ලබන සභාවෙදි පුවවන්නම් වෙනම කාල පරිච්ජේදයක් වෙන්කරල දෙන්න මේ ගැන සාකච්ජා කරන්න අපට. එතකොට අපට දීර්ස ලෙස සාච්ජා කරල හරි දෙයක් කරන්න පුළුවන්. මං දන්නෑ ගිය පාර මේ සැලැස්මෙදි සැලැස්මට ආපු ඒවයින් මොනවද ක්‍රියාත්මක වුණේ කියල. එහෙම පොඩි ගැටලුවකුත් තියෙනවා. ඒක නිසා මේක දීර්ස ලෙස සාකච්ජා කරමු ලබන සභාවෙදි කාලයක් අරගෙන.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය ප්‍රශ්නෙ ඔබතුමාල විසින්ම ඉදිරිපත් කරල වෙනත් විශේෂ සභාවක් තිබ්බා. ඒ සභාවෙදි කිසිම ගරු මන්ත්‍රීවරයෙක් දෙවෙනි එකේදි නම් සංශෝධන ඉදිරිපත් කරේ නැහැ. ඉතින් මේකත් එහෙම නොවී අධ්‍යනය කරල එන්න කියල මං ඉල්ලා සිටිනවා. ඊලඟට අනෙක් එකට පිළිතුර පසුව

ලබාදෙනවා. ලේකම්තුමිය විසින් පසුව ලබාදේවි. ඇයි එහෙම වුණේ කියන එක. ඒක පළාත් සභාවෙ පරිපාලනමය පැත්තෙන් ලබාදී ඇති පිළිතුරක්.

**තීරණය -**

2021 ක්‍රියාකාරි සැලැස්ම අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතු එම්. ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කළ අතර , ප්‍රජා සංවර්ධන නිලධාරී සහ තොරතුරු තාක්ෂණ නිලධාරි යන තනතුරු දෙක නගර සභාවේ අනුමත තනතුරුවලට නැති බවත් ඊට අදාල ලිපිගොනු පරීක්ෂා කරන තෙක් මෙම යෝජනාවට විරුද්ධව වන බව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් පැවසු අතර 2021 ජනවාරි මස පැවැත්වීමට නියමිත මාසික සභා රැස්වීමේදි සංශෝධන ඉදිරිපත් කිරීමට යටත්ව 2021 ක්‍රියාකාරි සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**05.01.02 පවත්නා කොරෝනා වසංගතය හමුවේ ඇතිව ඇති ආර්ථික අපහසුතාවයන් හා අසීරුතාවයන් සැලකිල්ලට ගනිමින් ජනතාවගේ පොදු යහපත උදෙසා අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශෙය් දැනට පොත් ඉල්ලා ඇති පාසැල් සිසුන්ට, දහම් පාසැල් සිසුන්ට, ස්වාමීන් වහන්සේලාට 2021 වර්ෂයේ අධ්‍යාපන කටයුතු සිදුකිරීමට අවශ්‍ය අභ්‍යාස පොත් ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දෙවැනි එක. පවත්නා කොරෝනා වසංගතය හමුවේ ඇතිව ඇති ආර්ථික අපහසුතාවයන් හා අසීරුතාවයන් සැලකිල්ලට ගනිමින් ජනතාවගේ පොදු යහපත උදෙසා අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශෙය් දැනට පොත් ඉල්ලා ඇති පාසැල් සිසුන්ට, දහම් පාසැල් සිසුන්ට, ස්වාමීන් වහන්සේලාට 2021 වර්ෂයේ අධ්‍යාපන කටයුතු සිදුකිරීමට අවශ්‍ය අභ්‍යාස පොත් ලබාදීම සුදුසු යැයි යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ස්ථිර කරනවා මේ යෝජනාව

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙම යෝජනාව මං ඉදිරිපත් කරන්නේ ප්‍රධාන වශයෙන්ම හේතුවුණේ නොමිලේ අභ්‍යාස පොත් ලබාගැනීම සඳහා අපෙන් පොත් ඉල්ලුම්කරුවන් 2200 ක් විතර නෙ. කීයද ගාන? ප්‍රජා සංවර්ධන මිස් ඉන්නවද ? කෝ ප්‍රජා සංවර්ධන මහත්මිය. එන්න කියන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඇත්තටම ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි මෙතන සභාව ගෙනියනකොට ගරු සභාපතිතුමා ගිය සභාවෙදිත් අපේ විපක්ෂ ගරු මන්ත්‍රීවරුත් පෙන්වා දුන්නා අදාල නිලධාරීන් ගෙන්වන්න ගරු සභාවට. නැත්නම් මේ සභාව ගෙනියන්න බැහැ. ඒක හින්දා කරුණාකරල මේ සභාවට අදාල නිලධාරීන් ගෙන්නන්න

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනිවාර්යෙන්. ගෙන්විය යුතුයි. ඔවුන් සිටිය යුතුයි. 2200 ක් විතර අපෙන් ඉල්ලල තියෙනව පොත්. නමුත් ග්‍රාම නිලධාරීන් විසින් පොත් ලබාදීමට සුදුසු යැයි කියල අනුමත කරල තියෙන්නෙ 1500 දෙනෙක් විතරයි. ආදායම් මට්ටම වැඩියි. ඒ වගේ රාශියක් ඉන්නවා. අපි කල්පනා කරා මේ කොරෝනා ව්‍යසන අවස්ථාව වෙනකොට ඒ අවස්ථාව තුළ අපගේ මිනිස්සුන්ට ඇත්ත වශයෙන්ම රජයේ සේවකයින් වුණත් ඒ වගේම මොන විදියෙ තත්වයේ වුණත් යම්කිසි අමාරුවක් තියෙනවා ඒ කියන්නෙ එදිනෙදා ව්‍යාපාර කරපු අයට වුණත් අමාරුවක් තියෙනවා . මෙම පොත් ලබාගැනීම. ඒ නිසා මං හිතනවා සල්ලි සමහර වෙලාවට යම් රැකියාවක් තියෙන එක්කෙනෙක් වුණත් ඒක ඉල්ල තියෙනවා. ඒ නිසා අපි කල්පනා කරා උදාහරණයක් වශයෙන් කරිත්තකන්ද ග්‍රාම සේවා කොට්ඨාශයේ 108 දෙනෙක් ඉල්ලල තියෙනවා. 100 ක් ග්‍රාම සේවක ප්‍රතික්ෂේප කරල තියෙනවා. පොල්වත්තෙත් එහෙමයි. හෙප්පුමුල්ලෙත් එහෙමයි. කෙරමිණියෙ එහෙමයි. කළුවඩුමුල්ලෙ එහෙමයි. ඉතින් ඒ නිසා ළමයි 700 කට විතර මමත් ඇත්ත වශයෙන්ම මම දන්නවා. මමත් දරුවන් තිදෙනෙක් ඉන්න පියෙක්. ඒ තුන්දෙනාට පොත් අරන් දෙන්න ගියාම කොච්චර වුණත් අමාරු තත්වයක් සමහර අවුරුදුවල අපටත් ඇවිල්ල තියෙනවා. ඉතින් ඒ නිසා රජයේ සේවකයෙකුට විශේෂයෙන්ම අද ගත්තොත් එහෙම අපේ නගර සභාවෙ රාජ්‍ය සේවකයෙක් වුණාට ඔහු කම්කරුවෙක් ඔහුට හම්බ වෙන්නෙ රු.35000/- ක විතර පඩියක්. ඒ පඩියෙන් ළමයි තුන්දෙනෙක් හිටියොත් එහෙම ඒ මාසෙ ඒ ගොල්ලොන්ට කන්න බැරි වෙනවා. ඉතින් ඒක නිසා අපෙන් ඉල්ලල තියෙනවනම් මං හිතන්නෙ වඩාත්ම සුදුසුම යුතුකම එය ලබා

දිම. එමනිසා මා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මෙවර විතරක් ඒ ආදායම් තත්වය නොසලකා ඉල්ලා ඇති සියලු දෙනාටම ලබාදීමේ අනුග්‍රහය ලබාදෙන්න කියල. මොකද මේ කොරෝනා ව්‍යසනයක් තියෙන වෙලාවෙ මිනිස්සුන්ට එම දැරීම අපහසු නිසා අපි දැන් මේක ගරු මන්ත්‍රීවරු කැමති වුණොත් අපි මේක ගරු ආණ්ඩුකාරතුමාගෙනුත් අනුමත කරල තමයි දෙන්න වෙන්නෙ. අපි කොහොම ගියත් අපි දැනට පොත් සියල්ලම ගෙන්නල ඉවරයි. ලබන සතියෙ විතර අපි පොත් ලබාදෙනවා අදාල කොට්ඨාශවලටම ගිහිල්ල. ඉතින් අනිත් අයටත් අපි ලබාදෙනව අපේ ආණ්ඩුකාරතුමාගෙ අනමැතිය අරගෙන ඒකත් ලබාදෙන්න අපි සූදානමින් ඉන්නෙ. සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් මේ සඳහා සහයෝගය අපේක්ෂා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපේ හෙප්පුමුල්ල කොට්ඨාශෙ මේ පොත් ලබාදීමේදී අපි 154 ක් අයදුම්පත් ඉදිරිපත් කරල තිබුණා. ඒ 154 න් 108 කගේ නම් කැපිල තියෙනවා. 46 යි මං හිතන්නෙ දීමට සුදුසු වෙලා තියෙන්නෙ. මං හිතන්නෙ මොකද ග්‍රාම නිලධාරීතුමිය අත්සන් කරපු නිසා. මෙතන තියෙනවා අයදුම්පත්‍රෙ ආදායම්ලාභියෙකු වීම හේතුවෙන් කියන එක. ඒක ග්‍රාම නිලධාරීතුමිය ඉරක් ගහල කපල නොමිලේ ප්‍රදානය කරනු ලබන පොත් ලබාදීමට සුදුසුයි කියල නිර්දේශ කරල තියෙනවා. ඉතින් මේ ඉතිරි ප්‍රමාණෙට පොත් දෙන්න ගියොත් අපට අපහසුතාවයට පත්වෙන්න වෙනව ගමේ. එතකොට එකසිය ගානක් කැපිල සුළු ප්‍රමාණෙකට දෙනකොට මිනිස්සුන්ගෙ මේ ගැන පොඩි කලකිරීමක් ඇතිවෙනවා අප්‍රසාදයක් ඇතිවෙනවා. මේ තීරණේ වෙනස් කරල අප ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් ගෞරවයෙන් මේ හතලිස් ගානෙට පොත් නොදී අනුමැතිය ලබාගෙන සියලුම අයට පොත් ලබාදෙන්න කියල. සියලුම දෙනාට එකවර පොත් ලබාදෙන්න කියල. මොකද ඔබතුමා ගැන යම්කිසි ප්‍රතිචාරයක් තියෙනවා අපි දන්නවා පළාත් පාලන මැතිවරණයේදී ඔබතුමා ජයග්‍රහණය කරපු වෙලාවේ නගරාධිපති ධූරයට පත්වෙච්ච වෙලාවෙ එක් අම්මා කෙනෙකුගෙන් අහල තියෙනවා එක ළමයෙක් අම්මෙ එහෙනම් අපට මේ සැරේ පොත් හම්බවේවි නේද කියල. ඉතින් අන්න ඒ වගේ ප්‍රතිචාරයක් මිනිස්සු අතරෙ තියෙනවා. මේ මන්ත්‍රීවරු ත් මන්ත්‍රිවරු 21ම මේකෙන් අපහසුතාවයට පත්වෙනව මේ පොත් දෙන්න ගියොත්. මෙහෙම භාගෙකට දැන් කරිත්තකන්දේ 08 දෙනාටයි අපිට 46 යි. එහෙම දෙන්න ගියාම අපිටත් මේකට සහභාගී වෙන්න බැරිකමක් වෙනවා. අන්න ඒක නිසා මේ සියලුම දේවල් මෙතන බලය ලබාගෙන අපි හැමෝම කැමතිවෙලා මේක ලබාගෙන එකට දෙන්න කියල මං යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , පටබැඳිමුල්ලෙ ප්‍රියන්ත එයා ඇත්තටම ආර්ථික දරිද්‍රතාවයෙන් ඉන්නෙ. දැනට ඉන්නෙ පටබැඳිමුල්ලෙ බද්දට. අපේ ගේ ඉස්සරහ තමයි ජන්දෙ තියෙන්නෙ. නමුත් ග්‍රාම සේවක මිස් ඒක අත්සන් කරල තිබුණෙ නැහැ. ළමයි දෙන්නම පාසල් යනවා. ඇත්තටම අමාරුවෙන් ඉන්නේ. මම ඒකෙ පොඩි සටහනකුත් දැම්මා. මෙම තැනැත්තන්ට ඇත්තටම දිය යුතුයි කියල. ඒක නම් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ඒක කවුරුවත් දන්නවා. අර ප්‍රියන්ත කියන්නෙ. එයාගෙ ළමයි දෙන්නගෙ පොත්. ග්‍රාම සේවක නෝන ඒක ප්‍රතික්ෂේප කරල තියෙනව ගරු සභාපතිතුමා. මෙවර ජන්දෙ දැම්මෙ එහෙට.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මේ අවසර ඉල්ලන්නෙ ග්‍රාම සේවක මහත්වරු ප්‍රතික්ෂේප කරපු ඒව දෙන්න තමයි. ඒක අපි කිසි ප්‍රශ්නයක් නැහැ. අපට අයදුම්පත්‍රයක් භාරදීල තියෙනවනම් අපි අද සභාවෙ අනුමැතිය දුන්නොත් දෙන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා පළමුවෙන්ම කියනවා මේ පාසල් පොත් දෙන්නෙ ඉතාමත්ම සද්භාවයෙන්. තීරණයක් අරන් අපි කතා කරා නිකන් මේ සැරේ ආදායම් තත්වය නොබලා මේ පොත් දෙන්න කියලා. ඒක සභා සම්මත නොවුණට මං ඉල්ලීමක් කරනවා ගම්වල දැන් දීපු අයදුම්පත්‍රවලට ග්‍රාම සේවක මහත්තයා ආදායම් ගැන අනං මනං මොනව කිව්වත් දෙන්න තීරණය කරපු එක දෙන්න. මොකද නීත්‍යානුකූල තත්වය බලල සභාවෙ අනුමැතිය අරන් ඔබතුමා ගරු ආණ්ඩුකාරතුමාගෙත් අනුමැතිය අරන් ඒ පොත් ලබල දෙන්න. මොකද පොත් බෙදන්න ගිහිල්ල මෙයාට අයදුම්පත්‍රය දීල මෙයාට නොදුන්නොත් අපි ගමේ එක මන්ත්‍රීවරයෙකුටවත් වෙසෙන්න හම්බෙන්නෙ නැහැ. පක්ෂපාතීව දුන්නයි කියනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි ඉතාම සද්භාවයෙන් කියනවා මන්ත්‍රීවරු එක්කෙනෙක්වත් විරුද්ධ වෙන්නෙ නැහැ. මේ පොත් ලබාදීම ඔබතුමා සභාවෙ අනුමැතිය අරගෙන ගරු ආණ්ඩුකාරතුමාට කියල නීත්‍යානුකූල තත්වෙට පත්කරගෙන අපව අපොහොසත් නොකරන විදියට ඉල්ලමින් මේක ලබාදෙන්න කියල මා ඉතාමත්ම සද්භාවයෙන් ඉල්ලා සිටිනවා මේක කරන්න. අනිවාර්යයෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය අපි දැස් පාදන්න දෙන්න ඕන හොඳ චේතනාවකින්. මේක ආයෙ විරසක කරන්න එපා. මේක ලබා දෙන්න කියල ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඒ වගේම ලේකම්තුමිය ඇතුලු සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් සහ මාධ්‍යවේදීන් ඇතුලු සියලුම නිලධාරීන්ගෙන් අවසරයි. නගර සභාව මගින් ලබාදෙන පොත් කට්ටල පොත් සම්බන්ධව. ඇත්තටම කියනවා නම් රටේ ආර්ථික තත්වයත් එක්ක මේක ලබාදිය යුතුයි. මේකෙ තියෙනවා 2200 ක් නිකුත් කළා කියල අයදුම්පත්. ඒ වගේම 1500 ක් සුදුසුයි කියල ග්‍රම සේවකරු නිර්දේශ කරල තියෙනවා. ගරු සභාපතිතුමනි මම දැනගන්න කැමතියි ග්‍රාම සේවකවරු කොට්ඨාශ මට්ටමින් නිර්දේශ කළ අයදුම්පත් ගණන.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ප්‍රජා සංවර්ධන නිලධාරීට ඒක ඉදිරිපත් කරන්න කියන්න. ප්‍රජා සංවර්ධන නිලධාරීගෙ අතේ තමයි තියෙන්නෙ. මම ඇත්තටම මේ ගාන ලොකු ගානක්. වෙනසක් කරන්න ඕන.නිසා තමයි මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කළේ. නැත්නම් ඇත්තටම දෙමව්පියො අපහසුවට ලක්වෙලා ඉන්නෙ. මේ කොරෝනා හින්ද ඇත්තටම මේ පදික වේදිකාවේ වෙළදාම් කරන එක්කෙනෙක් හරි කඩයක් සාප්පුවක් තියෙන කෙනෙක් හරි කඩවල අද වෙළදම නැහැ. ඉතින් ඒක නිසා තමයි අපි මේක ඉදිරිපත් කරේ.ඒ දෙන මිනිස්සුන්ට දෙන්න ඕන. ඉල්ලල තියෙනවනෙ අපෙන්. ඉල්ලන්නෙ නැති කට්ටියට නෙමෙයි.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි ඒ ඉල්ලපු අයදුම්පත් එක්ක ඒ සියලු දේවල් ලබාදෙන්න කියල ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම මතක් කළ යුතුයි ගරු සභාපතිතුමනි අදාල විෂය කරන නිලධාරීන් මෙතෙන්ට අනිවාර්යයෙන් සහභාගී විය යුතුයි. නිලධාරීන් එක්කවත් කිසි කෙනෙක් එක්කවත් කිසි ගැටලුවක් නැහැ. ප්‍රශ්නෙකුත් නැහැ. අපි සභාවක් විදියට සියලු දේවල්වලට උදවු කළා. ඒ නිසා අපි පරිපාලනය සම්බන්ධවත් කණගාටු වෙනවා ඇත්තටම. ඔබතුමත් දැනගත යුතුයි මේවා සභාව පටන් ගන්න කොට මේ කටයුතු නිලධාරීන් හරහා දැනුවත් කරල නිලධාරීන් සියලු දෙනා විෂය හරහා ගෙන්නල ඒ ගැන කටයුතුකරන්න කියල ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

මානුෂීය ගුණාංග ඇති කිසිම මහජන නියෝජිතවරයෙක් ඔබතුමාගේ ඔය ඉල්ලීම සම්බන්ධයෙන් විරුද්ධ වන්නේ නැති බව අපට විශ්වාසයි. මේ අවස්ථාවේ අපිත් කියනවා. මේ අපේ බල

ප්‍රදේශයෙත් මම හිතන්නේ දරුවො 200 කට ආසන්න සංඛ්‍යාවක් කැපුණු බවටයි මට යන්තම් සැලවුණේ. ඒ කියන්නෙ අඩු ආදායම්ලාභී කියන ශීර්ෂය කප්පාදු කරපු දරුවො. ගරු සභාපතිතුමනි මෙම පොත් බෙදාදීම වට දෙකකට නොපවත්වා අපේ ධර්මදාස මැතිඳුන් ප්‍රකාශ කළ පරිදි මෙම සියලුම ගැටලු තැන් නිරවුල් කරගෙන ගරු ආණ්ඩුකාරතුමාගෙ නිර්දේශය අරගෙනම තිබුණොත් තමයි වඩා ඵලදායි වෙන්නෙ. මොකද අපිට උත්තර දෙන්නට අපහසු වෙනවා. ඒක නිසා යම් පමාවක් ඇති වුණත් එම තත්වය උදාකරගෙනම මේක දෙන්න කියන එකයි අපේ අදහස.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙම ඔබතුමා දාපු 05.01.03 පවත්නා කොරෝනා වසංගත තත්වය හමුවේ ආර්ථික අපහසුතාවයන් හා අසීරුතාවයෙන් පෙළෙන කට්ටියට දහම් පාසල් ළමුන්ට පොත් බෙදාදීම ඉතාමත්ම. අපි මේක මං හිතන්නෙ පහුගිය සභාවක අනුමත කරපු කර්තව්‍යයක්. මේකෙ නීත්‍යානුකූලව ගැටලුවක් පැන නැගී ඇති බව අපිට ක්‍රියාවෙන් පෙන්නේ. මොකද අපි අඩු ආදායම්ලාභී කියන එක තමයි අනුමත කරේ සභාව. ග්‍රාම නිලධාරීන් මං හිතන්නෙ ඔබතුමාට මතක ඇති කලින් දෙනකොට මේ ඉන්න ග්‍රාම නිලධාරීන්ම තමයි මේක දෙන්න අපට අනුමත කරා. පහුගිය වකවානුවෙ. පළමුවෙන්ම මම දැඩි ලෙස කියනවා මේ විෂයභාර නිලධාරීතුමියට එන්න කියල. මොකද මේ ප්‍රශ්න අපි විසඳන්න නම් එතුමියගෙත් අදහස් ගන්න ඕන. එතුමිය තමයි එහෙනම් නීත්‍යානුකූලව දෙන්න ඕන. මේක මේ අපි කියන්නෙ ඒකයි. මොකද යම් වැඩක් කරන කොට කිසිදේකට අපි මේක පැහැදිලි විනිවිද භාවය තුළ නීත්‍යානුකූලව ගලප්පන්න නම් ඒ නිලධාරීන්ගෙ සහායත් ලැබෙන්න ඕන. අපි අත උස්සල දෙන්නෙ ඒකයි. මොකද මේක අපි අනුමත කරපු එකක්. අනුමත කරපු එකක් නොදීමට හේතුකාරණාව තියෙන්නෙ අඩු ආදායම්ලාභී කියන එක කපපු නිසානෙ. එතකොට අපි මේක නීතියට ගලප්පන්න ඕන. අද පුළුවන් ඔබතුමා හොඳයි දාල තියෙනව කොවිඩ් වසංගත තත්වය තුළ කියල. මේ කොවිඩ් වසංගත තත්වය තුළ නම් මේක ගලප්පන්න පුළුවන් අපට ආපදා කළමනාකරණ කමිටුවෙන් වාර්තාවක් අරගෙන මේක දීමට අපි කවුරුවක්කත් ඇත්තටම විරුද්ධ වෙන්නෙ නැහැ. මොකද අද තියෙන රටේ පවතින තත්වය තුළ. අම්බලන්ගොඩ නගරයේ සියලුම කොට්ඨාසවල ළමුන්ට ඒක දීම ගැන ගැටලුවක් නැහැ. හැබැයි අපට පොඩි කණගාටුවක් තියෙනව මේ නිලධාරීතුමිය නේන්නෙ මොකද කියන එක ගැන. අන්න ඒකයි ප්‍රශ්නෙ තියෙන්නෙ. නෑ මොනව කරත් සභාව මේ ගරු

සභාව තමයි මේ පරිපාලන කටයුතු සඳහා ඒ අවශ්‍ය කරන මූල්‍ය ප්‍රතිපාදනද මේව මන්ත්‍රීවරු එක්ක සාකච්ඡා කරල අනුමත කරන්නෙ. ඇත්තටම අපි බලාපොරොත්තු වෙනව ඒක. ගරු සභාපතිතුමා බලල ඒක දෙන්න. කිසි ගැටලුවක් නැහැ. හැබැයි මේකෙ නීත්‍යානුකූල තත්වය ක්‍රමවේදයකට අනුගතවෙලා ඒක ලබාදෙන්න. කිසි ගැටලුවක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රිනී චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, කොට්ඨාශය තුළ වාසය කරන ජනතාවගේ ඇත්තටම ප්‍රශ්න ගැටලු ගැන මහජන නියෝජිතයො විදියට කොට්ඨාශයේ සියලු දෙනාම දන්නවා. මං මේ වෙලාවෙ ඇත්තටම ප්‍රකාශ කරනවා. මේ පවතින තත්වයත් එක්ක ගොඩක් මිනිස්සු මේ අවස්ථාවේ ආර්ථිකමය ගැටලුවලට මුහුණපාල තියෙනවා. ඒ නිසා මේ යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. අයදුම්පත්‍ර ඉදිරිපත් කරපු සියලුම දෙනාට ඒ පොත් ලබාදෙන්න කියල මම යෝජනා කරනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මොකද ඒ නිලධාරියා පැමිණෙනවද? නිලධාරියා පැමිණියාට පස්සෙ ලේකම්තුමිය උත්තර දේවි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මම ඉල්ලීමක් කරනවා මේ වගේ නිලධාරීන් මේ සභාවෙ තියාගන්න එපා. මාසෙකට සැරයක් මේ සභාව රැස්වෙන්නෙ. කරුණාකරලා මේ සභාවට එන්න බැරිනම් මෙතන නියෝජනය කරන්නෙ මුළු නගරයෙම ඉන්න ජනතාවගේ නියෝජනයක්. ඒ ජනතාවගේ නියෝජනය සම්බන්ධව මෙතන ගරු මන්ත්‍රීවරු නඟන ප්‍රශ්නවලට මෙතනඅදාල විෂයභාර නිලධාරියා මෙතන නැත්නම් ඒ නිලධාරියා මේ සභාවට අවශ්‍ය නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා මං ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා මේ වගේ නිලාධාරීන් සම්බන්ධව ඔබතුමා ක්‍රියාමාර්ගයක් ගන්න. නැත්නම් මේ සභාවක් ගෙනියන්න බැහැ. දිගින් දිගටම අපි ගිය සභාවෙත් කිව්වා මේ අදාල නිලධාරීන් මේ ස්ථානයට කැඳවන්න කියල. මොකද ගරු මන්ත්‍රීවරු ප්‍රශ්න කරාම ඔබතුමාටත් ඒ අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. ලේකම්තුමියටත් උත්තර දෙන්න බැහැ. අදාල නිලධාරීන් එන්නෙ නැතිව .ඒ නිසා කරුණාකරල මේ වගේ නිලධාරීන් ගැන නීත්‍යානුකූලව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා .

**ගරු නගර සභා මන්ත්‍රිනී චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මොකුත් දන්නල තියෙනවද අසනීපයි කියලවත්. කරදරයක්ද දන්නෙ නැහැනෙ.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ලේකම්තුමිය ඇත්ත වශයෙන්ම මේ විනයානුකූලව පියවර ගන්න. නැත්නම් ඉතින් මේක කරන්න බැහැ. පහුගිය සභාවෙත් එතුමිය හිටියෙ නැහැ. අද ලේකම්තුමිය එතුමිය ආවානම් ඒ කියන්නෙ අත්සන් කරල කාර්යාලයේ හරි ඉන්න ඕන. ඒ කියන්නෙ මේ අවස්ථාවෙ කාර්යාලයෙත් නැහැනෙ. කොහේහරි ගිහිල්ල. ඒ ගැන හොයල බලන්න. ඇත්තටම සභාපතිවරයා කාර්යාලය පාලනය කරන්නෙ නැහැ. කාර්යාලය පාලනය කරන්න ඕන ලේකම්තුමියක් ඉන්නවා. ඒ අදාල අංශභාර නිලධාරීන් ඉන්නවා. ප්‍රධානීන් ඉන්නවා. ඒ අය විසින් පාලනය කරනවා. අපි කරන්නෙ කාර්යාලයත් මහජනතාවත් අතර තියෙන සම්බන්ධතාවය මත ජනතාවට වැඩකිරීම තමයි අපේ ගරු මන්ත්‍රීවරු සහ සභාපතිවරයා කරන්නෙ. ඉතින් කාර්යාලයේ සේවකයන් පාලනය කිරීමේ හැකියාව ලේකම්තුමිය ඇතුලු අංශ ප්‍රධාන නිලධාරීන් විසින් කළ යුතුයි. අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕන ඒගොල්ලො. මේ කිසිවක් අපේ පෞද්ගලික දේවල් නෙමේ. සියලු දේවල් පොදු දේවල්. ඒක තමයි ඒකෙ වගකීම පරීක්ෂණයක් කරන්න කියල කිව්වෙ. සාධාරණ හේතුවක් තියෙනවද බලන්න. සාධාරණ හේතුවක් තියෙනවනම් අපි පිළිගන්නවා. මේ යෝජනාවට විරුද්ධ ද කවුරුවත්. එකඟයි. ඒකමතිකව සම්මත වුණා සේ සලකනවා. ඒ අදාල ග්‍රාම සේවක මහත්වරුන් විසින් ඉදිරිපත් කරන වාර්තාව සභාව යන අතරතුරදී ඉදිරිපත් කරන්නම් ගරු මන්ත්‍රීවරුන්ට.

**තීරණය**

පවත්නා කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ඇති වී ඇති ආර්ථික අපහසුතාවයන් හා අසීරුතාවන් සැළකිල්ලට ගනිමින් ජනතාවගේ පොදු යහපත උදෙසා අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ නගර සභාවෙන් දැනට පොත් ඉල්ලා ඇති පාසැල් සිසුනට , දහම් පාසැල් සිසුනට හා පිරිවෙන්ගත ස්වාමින් වහන්සේලාට 2021 වර්ෂයේ අධ්‍යාපන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය අභ්‍යාස පොත් කට්ටල ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත වීය.

**05.01.01 2021 වර් ෂය සඳහා අයවැය ලේඛණය අනුමත කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සහගත කරන ලදී.**

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මීලඟට මම 2021 සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ අයවැය ඉදිරිපත් කරල සියලු දෙනාටම යෝජනාවක් වශයෙන් අපි අතට පත්කරල තියෙනවා. එය මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ස්ථිර කරනවා ගරු සභාපතිතුමනි.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා ජනවාරි මාසයේ මාසික සභාවට සහභාගි වි තිබෙනවා. එත් එහි සහභාගි නොවු ලෙස සටහන් වී තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කිවෙනි පිටද?

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

156 පිටුවේ

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමා සහභාගි වි තිබෙනවා. නමුත් සහභාගි නොවු ලෙස සටහන් වී තිබෙනවා. ජනවාරි මාසයේ.අන්න එක සංශෝධනය කරන්න ලේකම්තුමියනි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, තවත් සංශෝධනයක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කියද පිටු අංකය.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**

126 පිටුවේ පහළ තිබෙන යෝජනා තුනෙන් දෙවෙනි එක පනියන්දුව අතුරු මාර්ගය. පනියන්දුව පාර කාපට් කරලානේ තිබෙන්නේ. එම නිසා අතුරු මාර්ගය.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අතුරු මාර්ගය. සංශෝධනය කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි. 156 පිටුවේ මාගේත් පැමිණීමේ තිබෙනවා. මා නොපැමිණි බවට. මා ජනවාරි මාසයේ පැමිණියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අන්න ඒ පැමිණීම බලා එය ඇතුළත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මටත් තිබෙනවා. මූල්‍ය කමිටුවේ. මා මූල්‍ය කමිටුව පිට පිට හතර වතාවක් සහභාගි නොවූ බව සඳහන් වෙලා තිබෙනවා. මා සහභාගි නොවී සිටියේ නැහැ. පොඩ්ඩක් ඒ ගැන බලා මේවා කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එකත් පරික්ෂා කර බලා නිවැරදි කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපිට ගරු සභාපතිතුමා අයවැය යෝජනා කළා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ යෝජනා සම්බන්ධයෙන් ද කතා කරන්නේ. මා පොඩ්ඩක් මෙය ඉදිරිපත් කරන්නම්. මෙවර පුනාරාවර්තන ආදායම් වශයෙන් අපි 182,156,957 කුත් ප්‍රාග්ධන ආදායම 2,501,000වශයෙනුත් මිශ්‍ර ආදායම ලක්ෂ 184,657,957 වශයෙනුත් වියදම වශයෙන් නගර සභාවේ 155,385,870 ක් තිබෙනවා. ඒ අනුව සමස්ත මුළු වියදම නගර සභාවේ 184,606,870 ක් වශයෙන් තිබෙනවා. ඒ අනුව අපි සියළු වැඩසටහන් ඒ ලැබිය යුතු ආකාරයෙන් වෙන්විය යුතු ආකාරය සම්පූර්ණ දමා කටයුතු කර තිබෙනවා. සෑම මැතිවරණ කොට්ඨාශයක් සඳහාම මේ අනුව අපට ඉතිරිවෙනවා රුපියල් ලක්ෂ 12ක් බැගින් වූ සංවර්ධන යෝජනා ඉටු කිරිමට. ඊට අමතරව ප්‍රසෂ්ත අන්දමින් වැඩ කටයුතු කිරිම සඳහා අපි මෙම යෝජනාවලිය ඉදිරිපත් කර තිබෙනවා. ඒ වගේම මෙම අයවැය කෙටුම්පත් සාකච්ඡාවේදි අපි 2020.11.17 වන දින සාකච්ඡා කරලා සියළු එකඟ වූ සංශෝධන සහිතව තමයි මෙය ඉදිරිපත් කර තිබෙන්නේ කියා අපි සියළුම මන්ත්‍රීවරුන්ට දැනුම් දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපිට ඉදිරිපත් වෙලා තිබෙනවා 2021 අයවැය යෝජනාව. මෙහිදි මට කතා කරන්න සිද්ධ වෙනවා අපි 2018,2019,2020 වර්ෂවල අපි නොයෙකුත් ආකාරයේ යෝජනා

ඉදිරිපත් කර තිබෙනවා. එතකොට ඒවා වසරින් වසර ඊළඟ වර්ෂයට තල්ලු වෙමින් පැමිණ තිබෙනවා. එතකොට ඒ පිළිබඳව අපිට ගැටළුවක් තිබෙනවා. ඒ වගේම රජයේ විගණකාධිපති විසින් අපිට ලිපියකින් දන්වා තිබෙනවා. මේ මේ යෝජනා ඉෂ්ටවෙලා නැහැ. ඒ පිළිබඳව මන්ත්‍රීවරු සමඟ සාකච්ඡාවක් කරන්න කියා.  එහෙම ඒ ගිවිසුම පිළිබඳව සභාගත වෙලා එහෙම සාකච්ඡාවක් සිදු වෙලා නැහැ. ඒ වගේම අපිට කමිටු වාර්තා ලැබෙන්නේ මේ සභාවට පැමිණි පසු. එතකොට සභාවට පැමිණි පසු කමිටු වාර්තා ලැබුණාට පසු එය අපිට අධ්‍යනය කරන්න වේලාවක් නැහැ. අනිත් කාරණය තමයි මේ කමිටු වාර්තා අස්සේ සැඟ වූ යෝජනා තිබෙනවා. අපි සභාපතිතුමා කමිටු වාර්තාව ඉෂ්ඨ කරන කොටම මෙහේ කමිටු වාර්තාව ස්ථිර කරනවා. අපේත් වරදක් තිබෙනවා. අපි එකට විරුද්ධ වෙන්නේ නැහැ. අපි සභාපතිතුමා ගැන දැඩි විශ්වාසයක් තිබුණ නිසා. නමුත් ඒවා තුළ සැඟවුණු යෝජනා තිබිලා ඒවා ක්‍රියාත්මක වෙනවා. ක්‍රියාත්මක කරාම ප්‍රශ්න තිබෙන කොට ඇයි ඔගොල්ලන් මේවාට අත ඔසවා මේවාට එකඟ  වෙලා තිබෙන්නේ. නමුත් එතන ඇත්ත වශයෙන්ම සැඟවුණු සිද්ධියක් තිබෙනවා. එතන වංචාවක් වෙලා තිබෙනවා. අනික තමයි නගර සභාව වුණාම ස්වයං උත්පාදන මාර්ගයක් තිබෙන්න ඕන. මේ නගර සභාව යැපෙන්නේ සියයට සියයක්ම ජනතාවගේ බදු වලින්. මේ සංඛ්‍යා ලේඛණ බැලුවාම 84.7% ක් වැයවනවා මේ සභාව සභාපතිතුමා , උප සභාපතිතුමා , මන්ත්‍රී මණ්ඩලය සහ නිලධාරි මණ්ඩලය නඩත්තු කරන්න. එතකොට 84.7% ක් එහෙම වැයවන කොට 15.3% ක් තමයි නගරයේ ජනතාවට වැඩ කරන්න මුදල් ඉතිරිවෙලා තිබෙන්නේ. එතකොට ඇත්තටම සිද්ධ වෙන්නේ නගරයේ ජනතාවගේ බදු මුදල් වලින් අපි යැපෙනවා. සභාව තමයි යැපෙන්නේ. එක එහෙම නෙමේ වෙන්න ඕනේ. නගර සභාවක් වුණාම ස්වයං උත්පාදන මාර්ග වැඩසටහනක් තිබෙන්න ඕන. එහෙම එකක් නැහැ. අපි නගරයේ ජනතාවගේ බදු මුදල් වලින් අපි යැපෙනවා. සිදුවිය යුත්තේ එක නෙමේ. එමනිසා මෙන්න මේ මූලික කාරණා හේතුකොටගෙන මා මේ අයවැය යෝජනාවට වීරුද්ධ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, 2021 වර්ෂය සඳහා වූ අම්බලන්ගොඩ නගර සභාවේ අයවැය සඳහා මන්ත්‍රීවරියක් ලෙස ඕකන්ද ග්‍රාම නිලධාරී වසම මම නියෝජනය කරන්නෙ. හැබැයි මම ඔබතුමාගේ අයවැය සඳහා හැමදාම 2018, 2019, 2020 අයවැයවලට සම්පූර්ණ සහයෝගය ලබා දීල තියෙනවා. මොකද ලබා දුන්නේ ගොඩාක් බලාපොරොත්තු ඇතිව. නමුත් කණගාටු වෙනවා මම ඔබතුමා ගැන. මොකද 2018, 2019 වසරවල වර්තමාන නගර සභාව පාලනය ආරම්භ කළ

දින සිට  අයවැය වාර්තා 03 ක් සම්මත වී ඇති අතර මම මේ අයවැය ප්‍රතික්ෂේප කරන්න විරෝධතාවයන් ඉදිරිපත් කරන්නේ. මාගේ යෝජනා හා ගම්වැසියන්ගේ යෝජනා ඕකන්ද ග්‍රාම නිලධාරී වසමේ සංවර්ධනය කිරීමට යෝජනා කරත් එම යෝජනා මෙතෙක් ඉටු නොවී ඇති අතර, 2021 වර්ෂයේ අයවැය වාර්තාවේ සඳහන් වී ඇත. එබැවින් මේවා ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් මොකද අවුරුදු තුනක්ම කෙරුණෙ නැහැ. මගේ කිසිම විශ්වාසයක් නැහැ මේ අයවැය සම්බන්ධව. මාගේ දැඩි විරෝධය මේ අයවැයට දක්වා සිටිනවා.  ඒ නිසා මම අයවැය ප්‍රතික්ෂේප කරන්න කැමතියි. ප්‍රතික්ෂේප කරනවා. විශේෂයෙන් උදාහරණයක් ගත්තොත් පොල්වත්ත ආදාහනාගාරය. මම හැමදාම සභාවෙ කතා කරනවා ලංකාවෙ මිනිසුන් සහභාගීවන මේ ආදාහනාගාරෙ මා පදිංචිවෙලා ඉන්න ගම්මානෙ. මේක හදන්න. මේක හැදෙන්නෙ නැහැ. මිනිස්සු හැමදාම සභාවට බැනල යනවා. මේක මටත් අපකීර්තියක් මන්ත්‍රීවරියක් වශයෙන් කියල. ඒක මෙතෙක් ඉටුවුණේ නැහැ. කළුවඩුමුල්ල නාන ළිඳ ගැන. මොකද මිනිසුන් පරිහරණය කරපු නාන ළිඳ අද පාළු ළිඳක් බවට පත්කරලා. එය සකස් කරල දෙන්න කියල ඉල්ලීමක් කරා. සෝමරත්න මහතාගේ පැති බැම්ම ඕකන්ද. හැමදාම කියනවා මොකද ඒ මිනිස්සු අඳෝනා නගනවා ගියාම ඔබතුමාල මන්ත්‍රීල වුණාට වැඩක් නැහැ පැති බැම්මවත් හදාදෙන්න බැරිවුණා මේ සභාවෙ ඉඳල කියලා. ඒ නිසා මං මේ කරුණු නිසා මං මේ අයවැය ප්‍රතික්ෂේප කරනවා. ඒ වගේම කාර්යසාධන නගර සභා පනතේ 04 වැනි වගන්තිය යටතේ. මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබවහරණ පහසුව හා සුභසාධනය සභාව විසින් ඉටුකළ යුතුව තිබුණත් එම කර්තව්‍ය මෙතෙක් ඉටුවෙලා නැහැ. මේක අනාවරණය වීම සම්බන්ධව. ඊලඟට සමාලෝචිත වර්ෂය. විගණක වාර්තාව සම්බන්ධව කතාකරන්න කැමතියි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණනය ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම පනවා තිබූ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පිළියෙල නොකිරීමේ තත්ත්වය තුළ සභාව නීතිමය තත්ත්වයෙන් බැහැරව කටයුතු කිරීම. 2021 වර්ෂය තුළද මේ අන්දමින් සිදුවන බැවින් මේ අයවැයට විරෝධතාවය දක්වා ප්‍රතික්ෂේප කරනවා. අනිත් එක ගරු විගණකාධිපති ලෙස අංක 2018 අංක 19 දරණ පනතේ දෙවන විගණන විමසුමට අදාලව පිළිතුරු හා තොරතුරු මෙම අයවැය ලේඛනයට ඉදිරිපත් කර ඇතත් අද දිනය තුළත් කිසිඳු සභා වාරයකට ඇතුළත් නොකර සාකච්ඡා නොකළ අතර 2021 වර්ෂයේ අයවැය ලේඛනය නිවැරදි වන්නේ කෙසේදැයි අප හට ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා මං 2021 වර්ෂයේ අයවැය ලේඛනය දැඩි සේ ප්‍රතික්ෂේප කරනවා. ගරු සභාපතිතුමනි. තවත් කරුණක් මම කිව යුතුමයි. අපි සියලු ගරු මන්ත්‍රීවරුන් මේ මන්ත්‍රී සභාවෙ වාඩිවුණාම අපි සියලු දෙනාම සම මන්ත්‍රීවරියන් සහ

මන්ත්‍රීවරුන්. නමුත් අපට ලැබෙන වරප්‍රසාදවලදි අපි ලැයිස්තුගත මන්ත්‍රිවරියන් කියල මෙතනදි විරසකයක් වෙනවා. ලාබාදීමේදී කොටසකට වෙනත් විදියකටත් කොටසකට වෙනත් විදියකටත් සලකනවා. එක හා සමාන විදියට සලකන්නෙ නැහැ. පාර්ලිමේන්තුව දිහා බැලුවොත් අද ජාතික ලැයිස්තුවෙන් පත්කරපු මන්ත්‍රීතුමා තමයි අද අධිකරණ මන්ත්‍රී වෙලා ඉන්නෙ. පාර්ලිමේන්තුව දිහා බැලුවොත් අද ජාතික ලැයිස්තුවෙන් පත්කරපු මන්ත්‍රීතුමා තමයි අපේ අධ්‍යාපන ඇමතිවෙලා ඉන්නෙ. ජී.එල් පීරිස් මහත්තයා. ඉතින් අපි කණගාටු වෙනවා ඒ දේවල් අපට මේ සභාවෙන් ලැබෙන්නෙ නැහැ. ඉතින් ඒ නිසා මේ අයවැය අපි මොනව කතා කරත් මං ප්‍රතික්ෂේප කරනවා මේ 2021 අයවැය. මම තදින් ප්‍රතික්ෂේප කරල කියනවා විවෘතව අනිවාර්යයෙන් බෙදීමක් අවශ්‍යයි මේ අයවැයට විරුද්ධව. මේ අයවැයට විරුද්ධ වෙනවා. මේ වැඩ කෙරෙන්නෙ නැහැ. 2018 කෙරුණේ නැහැ. 2019 කෙරුණෙ නැහැ. 2020 කෙරුණෙ නැහැ. 2021 නොකෙරෙනවා කියල හොඳින්ම තේරෙනවා. ඒ නිසා මේ අයවැයට මම තදින්ම විරුද්ධ වෙනවා. මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා ඒ වගේම මේ අයවැය ප්‍රතික්ෂේප කරනවා. ස්තූතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මතක් කළ යුතුයි. 2021 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම කරන්න දින දාල තිබුණෙ දෙසැම්බර් මාසෙ 15 වැනිදා. කියන්න කණගාටුයි. නිලධාරීන්ටවත් සේවකයින්ටවත් ඇඟිල්ල දික් කරනවා නෙමෙයි. අපට අයවැය වාර්තාව කල් තැබුවයි කියල ලැබුණෙ රාත්‍රී 8.00 ට 9.00 ට විතර ලැබුණෙ. එදාම සවස තමයි 14 වැනිදා හවසම තමයි 4.00 ට පමණ අපට අයවැය වාර්තාව ලැබුණෙ. ඉතින් මේ කරුණු සැලකිල්ලට ගනිමින් මොකද සේවකයින්ට බැනල වැඩක් නැහැ අපි. පරිපාලනය සම්බන්ධවත් ඒ වගේම පරිපාලනය කරන ගරු සභාපතිතුමා වන ඔබතුමාටත් මේ සම්බන්ධව අපට ඇත්තටම ලොකු කණගාටුවක් තියෙනවා මේ සභාව යන පැත්ත ගැන බැලුවහම. ගරු සභාපතිතුමනි, සියලු ගරු මන්ත්‍රිවරුන්ගෙන් මං ඉල්ලා සිටින්නේ මේ වැඩ කටයුතු මේ නිලධාරීන් හරහා කෙරෙනකොට මීට වඩා විනිවිද භාවයකින් කෙරෙන්න ඕන. ඒ ගැන අපි ඇත්තටම කණගාටු වෙනවා. ඒ වගේම අද දින 2021 වර්ෂයේ ගරු සභාපතිතුමා විසින් අයවැය ඉදිරිපත් කරනු ලබනවා. අයවැය වාර්තාව කල්තැබීම සම්බන්ධව කිසිම ගැටලුවක් නැහැ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් එක අනුව සභාව කටයුතු කරගෙන යෑමේ අතුරු ව්‍යවස්ථාව යටතේ ඔබතුමාට ඒකෙ අයිතිය තියෙනවා. ඒ පිළිබඳ කිසිම ගැටලුවක්

නැහැ. අපි දැඩි සේ විරුද්ධ වෙනවා එම වැඩකටයුතු නොකිරීම සම්බන්ධයෙන්. මොකද අපට මේ නගර සභාවෙ යන පැත්ත ගැන කිසිම විශ්වාසයක් නැහැ. ඒක හින්දා තරයේ මේ අයවැයට 2021 වර්ෂයේ මං එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට විරුද්ධ වෙනවා. ඒ වගේම මතක් කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එහෙම තමයි විරුද්ධ වෙන්න ඕන. හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඒ වගේම මතක් කළ යුතුයි විශේෂයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා විදියට පක්ෂ පාට භේද නොතකා මොකද මගේ යුතුකම මම මන්ත්‍රීවරයෙක් විදියට පත්වෙච්ච දවසෙ ඉඳන් අම්බලන්ගොඩ නගර සභාව හොඳ තැනකට ගේන්න ඕන කියලා ඒ අධිෂ්ඨානයෙන් තමයි සභාපති පුටුවෙ කවුරු හිටියත් පක්ෂ භේදයකින් තොරව උදවු කරේ. නිහතමානීව කුහකකම් නැතිව හරි දේවල්වලට උදවු කරේ. අපට දැන් පේන විදියට මේ යන්නෙ අමුතු විදියකට. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ අයවැය ප්‍රතික්ෂේප කරන අතර බෙදීමකුත් මේ අයවැයෙන් මං ඉල්ලා සිටිනවා. විවෘත ඡන්ද බෙදීමකුත්. ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මතක් කළ යුතුයි අම්බලන්ගොඩ නගර සභාවේ කාලෝචිත වැදගත් යෝජනාවක් ගෙනාවා. මා විරුද්ධවීමට හේතු කාරණා කියන්නෙ කිහිපයක්. ගරු පාලක පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විදියට ගරු ගංගේ සරත් ශ්‍රීලාල් මැතිතුමා.  එම වැදගත් කාලෝචිත යෝජනාව තමයි දින මට හම්බවුණේ දෙවැනි අවස්ථාව. නගර සභාවෙ ගරු සභාපතිතුමාටත් නගර සභාවෙ ගරු මන්ත්‍රීවරයාටත් ගරු සභාවටත් වටිනාකමක් දුන් ආරම්භ වෙච්ච කාලෝචිත දින හතේ වැඩසටහන මොන හේතුවක් කාගේ අනුදැනුම පිට මේක නැවැත්තුවද කියන්න මං දන්නෙ නැහැ. ගමෙන් හොඳ වටිනාකමක් ලැබුණා දැන් තමයි නගර සභාවෙන් වැඩක් කෙරෙන්නේ කියල. නගර සභාවක් විදියට ගරු මන්ත්‍රීවරයෙක්ගෙන් බලාපොරොත්තු වෙන්නේ සමාජ සුභසිද්ධිය හා සමාජ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීම. ඒ කියන්නෙ පොඩි දෙයයි. නගරයේ සියලු කොට්ඨාසවල මන්ත්‍රවරුන්ගෙන් බලාපොරොත්තු වන්නේ කාණු ටික ශුද්ධ කරල දෙපැත්ත සයිඩ් ගහල යන්ත්‍ර සූත්‍ර දාල ඒ සියලුම සේවකයින් යොදා දින හතේ වැඩසටහන සෞඛ්‍ය හා කම්කරු සේවකයන් යොදවලා ඇත්තටම ගොඩක් වටිනා විදියට මට පුළුවන් වුණා උපරිම සහයෝගය ලබාදෙන්න මං ලබාදුන්නා. ඔබතුමාට මං අවස්ථා ගණනකදී කිව්වා මේක නවත්තන්න එපා මේක හොඳ යෝජනාවක් කියල. මරණයක් වුණාමත් ඒ දාපු යෝජනා වගේ මේක කරමු කයලා. ඉතින් මේ

ගන්න දැඩි තීරණ සම්බන්ධව දැඩි සේ විරුද්ධ වෙනාව මං මන්ත්‍රීවරයෙක් විදියට. ඒ නිසා මේ අයවැය මං මේ වෙලාවෙ ප්‍රතික්ෂේප කරනවා. විශේෂයෙන් මතක් කළ යුතුයි ඊට අමතරව ගම් මට්ටමින් ප්‍රජා මණ්ඩල හැදුවා අපි. මිනිස්සු එක්කන් ගිහිල්ල . ප්‍රජා මණ්ඩලය හදලා ප්‍රජාව හරහා යෝජනාව අරගෙන ඒ ප්‍රජාවත් ගත් යෝජනා මං හිතන්නෙ එක් මන්ත්‍රීවරයෙක් 15 ක් ඉදිරිපත් කරාම මං හිතන්නෙ 150 ක් විතර තියෙනවා. එම යෝජනාවලින් කියන්න කණගාටුයි 4% කට වඩා මං දන්නැහැ කොට්ඨාසවල යෝජනා නොකෙරුණු යෝජනා තියෙනවා. ඉතින් මන්ත්‍රීවරයෙක් විදියට බලාපොරොත්තු වෙන්නෙ ඒ ගමේ තියෙන යටිතල පහසුකම් නැංවීම සඳහා උපරිම සහයෝගය ගරු සභාපතිතුමා හරහා නගර සභාව හරහා ගන්න. ඉතින් ඇත්තටම කියන්න කණගාටුයි මොකද අපි උපරිම සහයෝගය ලබාදුන්නනෙ. උපරිම සහයෝගය ලබාදුන්නා. මධ්‍යම රජයෙන් වෙච්ච ගොඩක් දේවල් තමයි සිද්ධවෙලා තියෙන්නෙ. තව එකක් තමයි මම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විදියට අපි සහයෝගය ලබාදෙනකොට මන්ත්‍රීවරු ඔක්කොම ප්‍රජා මණ්ඩල යෝජනා ක්‍රියාත්මක වෙනකොට අපි මෝඩයෙ නෙමෙයි ඉගෙන ගත්තු චරිත. ප්‍රජා මණ්ඩල යෝජනා ක්‍රියාත්මක කිරීමේදී අගට දානවා අපේ යෝජනා. හරිම කියන්න කණගාටුයි මොකද දෙසැම්බර් මාසෙට දැම්මට පස්සෙ ඇස්තමේන්තු හදල තාක්ෂණසේවා නිලධාරී හරහා ගිහිල්ල අපි එක්කන් යනව බලෙන්ම වගේ එක්කන් ගිහිල්ල ඇස්තමේන්තු හදවන්න ඕන. ඒක හින්ද ලොකු අපහසුතාවයකට අපි පත්වෙලා තියෙනවා. ඒ නිසා මේ ගැන කණගාටුව ප්‍රකාශ කරනවා. ඒවගේම විශේෂයෙන් මතක් කළ යුතුයි ප්‍රජාවට අවශ්‍ය යෝජනා වෙනුවට වෙන වෙන යෝජනා පරිපූරක ඇස්තමේන්තුවක්වත් නොදා ක්‍රියාත්මක කිරීම. ඒ හින්දා විශේෂයෙන් මේ 2021 අයවැය ඉදිරිපත් කරන මොහොතේ දැඩිසේ පිළිකුල් සහගත ලෙස මං මේ අයවැය ප්‍රතික්ෂේප කරනවා. ඊට අමතරව ගරු විගණකාධිපතිතුමා 2019 සභා තටයුතු කරගෙන යාමේ අතුරු ව්‍යවස්ථාව යටතේ විගණන වාර්තාව ඉදිරිපත් කරල තියෙනවා. මේ යටතේ විෂයයන් ගණනාවක විගණන වාර්තාව ඉදිරිපත් කරල තියෙනවා. අඩුපාඩු ගොඩක්. ඒක හින්දා ඒ සම්බන්ධවත් කටයුතු කරන්න කියමින් මං මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. ඊට අමතරව 2019 වර්ෂයේ ජනවාරි 01 වැනි දින වන විට සභාවට ලැබිය යුතු හිඟ ආදායම් දොලොස් කෝටි තිස් හය ලක්ෂ තිස්තුන්දහස් පන්සිට හැත්තෑ හතරක් (රු.123633574/) ක් වූ අතර වර්ෂය තුළ බිල් නිකුත් කිරීම්වල එකතුව රු. හැටහය කෝටි තිස්නම ලක්ෂ තුන්දහස් නමසිය තිස් දෙකක් (රු.66393932/-) තිබී ඇති අතර සභාවට අයවිය යුතු මුළු ආදායම ලෙස 2019 වර්ෂය තුළ දහනම කෝටි තිස්නම ලක්ෂ තිස්තුන්දහස් නමසිය තිස් එකක් වුවද (රු.193933931/-) එකතු කර ඇති ආදායම දහතුන් ලක්ෂ නමදහස් එකසිය හතලිස් දෙකකි.

(රු.1309141/-) එකතු කර ඇති ආදායමින් 36% කි. මේ තත්ත්වය තුළින් පිළිබිඹු වන්නේ 2019 වර්ෂයේ අයවැය ලේඛනය ඔබතුමා දක්වා ඇති අකාර්යක්ෂමතාවයයි. ඒ අනුව 2021 ඉදිරි වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ඇස්තමේන්තුවලට අපගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමනි, මට කිවයුතු කරුණක් තියෙනවා ගරු සභාවේ සභාපතිතුමා විදියට විශේෂයෙන් මතක් කළ යුතුයි ජේ.එම්.එස්.ද සිල්වා මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ගත් අද අප අතර නැහැ. ලොකු හෘදයක් එතුමාට තියෙනවා. අපි සහයෝගය ලබාදුන්නා මේ වර්ෂ දෙකේදීම .මොකද අපේ මන්ත්‍රීවරු සියලු දෙනාටම කතාකරල අපි කුහකකම් නැතිව සභාවට අපි උදවු කරපු සභාපතිතුමාට. ඒ කිසි දෙයක් නොසලකා තමන්ගේ හිතු මනාපයට මං විශේෂයෙන් මතක් කළ යුතුයි පාලනය හා පරිපාලනය දෙකම අකාර්යක්ෂම වෙලා තියෙනවා. තම නොහැකියාව පිළිබිඹු වෙනවා මේ ගරු සභාවෙ. ඒ නිසා 2021 වර්ෂයේ අයවැය ඉදිරිපත් කරන අද මොහොතේ මම පිළිකුල් සහගතව මේ අයවැය ප්‍රතික්ෂේප කරන අතර ප්‍රසිද්ධ බෙදීමක් මං ඉල්ලා සිටිනවා මේ සභාවෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අද සභාවට ඉදිරිපත් කරන යෝජනාවට ඇත්ත වශයෙන්ම අයවැය යෝජනාවට මමත් මගේ හෘද සාක්ෂියට එකඟව ප්‍රතික්ෂේප කරනවා. මොකද ඇත්ත වශයෙන්ම ඔබතුමා දන්නවා. අපි මහජන නියෝජිතයො වශයෙන් සභාවට ඇවිල්ල නිතරම ඔබතුමාට අම්බලන්ගොඩ ජනතාවගේ ප්‍රශ්න තමා යොමු කරන්නෙ. ඒ හැම අවස්ථාවකදිම ඔබතුමා අපි මන්ත්‍රීවරු වශයෙන් මහජන නියෝජිතයො වශයෙන් අපි පක්ෂෙන් පත්වුණා කියල ඔබතුමා අපට නොසලකා හැරල නොයෙකුත් මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ විශේෂ සංවර්ධන වැඩ කරනකොට ඔබතුමා නිලධාරී මහත්වරුන්ට ප්‍රකාශ කරල තියෙනවා මට ඒ අවශ්‍ය කරන ලියකියවිලි දෙන්න එපා කියල. ඉතින් ඒ හින්දා ඇත්තටම අපි ඔබතුමා මේ අයවැය යෝජනාව සම්බන්ධයෙන් තරයේ මම ප්‍රතික්ෂේප කරනවා. අපි ඇවිල්ල තියෙන්නෙ ජනතාවට සේවය කරන්න. මහජන නියෝජිතයො වශයෙන්. ඒ ඇවිල්ල අපට ඒ දේ හරි ආකාරයෙන් අපේ ගමට අපේ නගරෙට කරන්න බැරිනම් අපි ඒක තව දුරටත් ඒ සම්බන්ධව ඔබතුමාට සහයෝගය දීම සුදුසු නැහැ කියන මතයේ තමයි අපි ඉන්නෙ. ඒ වගේම ගරු සභාපතිතුමනි, කළමනාකරණ රැස්වීමක් පවත්වනව ඔබතුමා. ඒකට කිසිම ගරු මන්ත්‍රිවරයෙකුගෙ සහභාගීත්වය ඔබතුමා සම්බන්ධ කරගන්නෙ නැහැ. ලේකම්තුමියත් ඔබතුමත් අනෙකුත් නිලධාරීනුත් විතරයි. ඒ කළමනාකරණ රැස්වීම පවත්වල ඉවරවෙලා ඔබතුමා අපේ සභාවට ගෙනැල්ල යෝජනා දානවා.

නමුත් ඒ යෝජනා අවස්ථාවේ ඇත්තෙන්ම අපි ඒක තරයේ හෙළා දකිනවා. මොකද අපි දැනුවත් වෙන්න ඕන මේ දේවල් මෙන්න මේ වගේ දේවල් තමයි කරන්නෙ කියල. ඒක හින්ද මහජන නියෝජිතයොත් කළමනාකරණ කමිටුවට සම්බන්ධ කරගැනීම ඔබගේ යුතුකමක් හා වගකීමක් කියල මං විශ්වාස කරනවා. අනිත් එක ගරු සභාපතිතුමනි, ඔබතුමා අපිට චෝදනා කරනවා නිතරම අපි ඔබතුමාගෙ සභාපතිකමට විරුද්ධ වුණයි කියල. නමුත් ගරු සභාපතිතුමනි, මම දැනුවත්ව මේ සභාවේ අයවැය සම්මත කරගන්න සැහෙන උත්සාහයක් ගන්නවා. ඒ මොකද ඔබතුමා හරි විදියට මේක පාලනය කරානම් අද සභාව තුළ අද මේ සියලුම ගරු මන්ත්‍රීවරු ඔබතුමාට සහයෝගය දෙනවා. ඒ හින්දා ඔබතුමා දැනගන්න ඕන අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන පුරවැසියා වශයෙන් ඔබගෙන් නගරයට විය යුතු යුතුකම හා වගකීම ඉෂ්ඨ කරන්න. එහෙමනම් ගරු සභාපතිතුමනි, අපි මේ අවස්ථාවේ ඔබතුමාට කියන්නෙ මේ අයවැය අපි තරයේ ප්‍රතික්ෂේප කරමින් අපගේ විරෝධය ප්‍රකාශ කරමින් මම ඒ සම්බන්ධව අම්බලන්ගොඩ ජනතාවට ඇත්තෙන්ම මේ අවස්ථාවේ අපි අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් ඔබතුමාට ඒ විරෝධය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

සුභ උදෑසනක් සියලු දෙනාටම. අම්බලන්ගොඩ නගර සභාවේ 2021 අයවැය වාර්තාව මේ ඉදිරිපත් කරන සභාවේ අපිටත් වචනයක් කතා කරන්න ලැබීම සම්බන්ධව අපි සතුටු වෙනවා. අපි දන්නවා මෙම අයවැය ලේඛනය මේක තමයි අම්ලන්ගොඩ නගර සභාවේ හදවත. මේක තමයි අපි වාර්ෂිකව අරගෙන අපගේ මහජනතාවගේ වැඩ කටයුතු කරන්න ඒවගේම මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉටු කරන්න. ඒ සියලු දේ ඇතුලත් කරල ලබාදෙන නීත්‍යානුකූලව අයවැය වාර්තාව. අපි දන්නවා අපි 2018 පත්වෙලා රජය විසින් පවත්වපු මැතිවරණය තුළ ඒ කොමසාරිස්තුමා පත්කරල සභිකයින් ගණන තෝරල ඒ නීත්‍යානුකූලව සභාව නියෝජනය කරන්න තිබුණු වකවානුව. ඇත්තටම මේකෙ ආරම්භය කතාකරොත් මෙතනින් ඕන එන්න. මේ බජට් එක මෙම අයවැය වාර්තාව ඉදිරිපත් කරන්න තිබුණේ පහුගිය 15 වැනිදා. නමුත් මේක ලැබුණෙ අපට 14 වැනිදා හවස 4.00 ට. ඊට පස්සෙ රෑ 9.00 ට විතර අපිට ලියුමක් ආවා මේක 22 වැනි අද දක්වා කල් තිබ්බා කියල. මේ හැමදෙයක්ම මේ නගර සභා ආඥා පනත් මේ හැම දේම නීත්‍යානුකූලව කරන මේ රාජ්‍ය ආයතනයක් හැටියට අපි දකිනවා ඔබතුමාගෙ සභාපතිත්වය තුළ ධූරය තුළ ඒවගේම ලේකම්තුමියගේ ඒ නගර සභාවෙ පරිපාලනය ක්‍රියාත්මක කරන ප්‍රධානියා හැටියට වරදක් දකිනවා අපි. මේක තමයි අපේ ගරු මන්ත්‍රීවරු මේ සියලු බලාපොරොත්තු තියාගෙන ඉන්නෙ.

බලන්නකො අපි තමුන්නාන්සේ විරුද්ධව කතා කරන්න හැම දේකම ප්‍රශ්නයක් නැගුවොත් තමුන්නාන්සේ ඒකත් ප්‍රතික්ෂේප කරනවා. මොකද අපි නිතරම අපිට දෝෂාරෝපණය කරනවා මේ ලැයිස්තුගත මන්ත්‍රීවරුන් මං පිළිගන්නෙ නෑ සභාවෙ පිළිගන්නෙ නෑ කියල ඔබතුමා කියල තියෙනවා. නමුත් ඒකම නීත්‍යානුකූලව තමයි අර අයිරාංගනී මන්ත්‍රීතුමිය කිව්ව වගේ පත්කරල එව්වෙ. දැන් තියෙන්නෙ මේ නගර සභා බජට් එක ඉදිරිපත් කරල තියෙනවා. මේකෙ අම්බලන්ගොඩ නගර සභාවෙ මෙහෙවර මොකක්ද අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ වෙසෙන සමස්ථ ප්‍රජාව වෙත අවශ්‍ය පොදු පහසුකම් සපයා ඔවුන්ගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික කටයුතු ඉටුකොට ජීවන තත්ත්වය නංවා සමාජ ප්‍රගතිය ඇතිකිරීම තමයි මේකෙ මෙහෙවර. ඒවගේම ප්‍රතිපත්ති තියෙනවා. ඒ තුළ අපි දන්නවා මෙම නගර සභාවේ බජට් එක බැලුවහම මේ ඉලක්කම් 2020 ත් එක්ක සන්සන්දනය කරල ඕන විදියට හදන්න පුළුවන්. නමුත් අපි බලන්න ඕන මේ සමාජයට අපි දෙන සංවර්ධනය මොකක්ද? නගරයට දෙන සංවර්ධනය මොකක්ද? මේකෙ විශේෂයෙන්ම ඒ අලුත් වෙනසක් ඇති කරන්න තියෙන ඒ මුදල් ප්‍රතිපාදන ආදායම් ලබාගෙන කොහොමද මේක නගාසිටුවන ක්‍රමවේදයක් අපිට මේකෙන් දකින්න නැහැ. අනිත් එක මේකෙ ඉදිරිපත් කරල තියෙනවා අර මම බැලුවා තමුන්නාන්සේලා සභාගත කරා විගණන වාර්තාව. මේකෙ ප්‍රශ්න ගැටලු රාශියයි. මේ සම්බන්ධව අපි කැඳවල තමුන්නාන්සේ අපි සාකච්ඡා කරල මේක නිවැරදි කරගන්න ක්‍රමවේදයක් ලැබුණෙ නැහැ. ඒක තමයි ප්‍රධානම දුර්වලතාවය. ඒකෙන් තමයි පේන්නෙ මං ඉස්සෙල්ල ඇහුවා ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර. ඒ සම්බන්ධවත් තාක්ෂණ නිලධාරී තනතුර ගැනත්. තිබුණද? ඇයි විගණනයේ පෙන්නල දීල තියෙනවා ඒක. ඇයි එතනදි ඒව ඉදිරිපත් නොවුණේ. එහෙනම් මේකට එන්නෙ නැහැනෙ. විගණන වාර්තා ඉල්ලනකොට ඒකෙ තියෙනවා කෙලින්ම පැහැදිලිව ලිපිගොනු ලබානොදීම කියන එකකුත් තියෙනවා. තමුන්නාන්සේ අරන් බලන්න ඒක. එතකොට 4% යි සංවර්ධන වැඩ කටයුතු වෙලා තියෙන්නෙ. 96% ක් වෙලා නෑ කියලත් කියල තියෙනවා. මං දන්නැහැ මේ රජයේ විගණන වාර්තාව රජය පිළිගන්න සහකාර විගණකාධිපතිතුමිය තමයි මේක අත්සන් කරල තියෙන්නෙ. මේක ඉදිරිපත් කරල තියෙන්නෙ විගණකාධිපතිතුමා. අපි කොහොමද මේකත් එක්ක මේ නගර සභාව යන්නෙ. මේක මන්ත්‍රීවරු දැනුවත් කරල මේක නිවැරදි නොකර යන්නෙ කොහොමද? සම්පූර්ණ වැරදියි. මේ බජට් එකේ මොකද හේතුව මේකෙ ඇතුලත් වෙලා තියෙනවා. අනිත් එක තමයි මේකෙ තියෙනවා ලිං 28 ක් තියෙනවා මේ බජට් එකේ. ලිං 28 ක් තියෙනවා. භෞතිකවම තියෙනවා ලිං 18 යි තියෙන්නෙ. ඇයි මේ බොරු මේවට ඇතුලත් කරන්නෙ ඇයි. ස්ථාවර වත්කම් වශයෙන් තියෙන ඉඩකඩම් කොහෙද මේකෙ තියෙන්නෙ. මෙව

තමයි අපේ නගර සභාවෙ දේපළ සහ වත්කම්. මේ වගේ දේවල් ඇතුලත් කරල මේ බොරු අයවැයක් වශයෙන් මේක සභාගත කරල යන්න ඉඩදෙන්න බැහැ. අනිත් එක මේක මෙම සභාව පිහිටුවල තියෙනව 2017 අංක 21 පනත තුළ. අපි ඒක තුළ කොමසාරිස්තුමා එවපු මන්ත්‍රීවරු පිළිඅරෙගන නැහැ. ඒකට කියන්නෙ මොකක්ද. පොත් බෙදල දුන්නහම ලැයිස්තුගත මන්ත්‍රීවරුන්ට 75 යි. ජන්දෙ දිනපු අය කියනව 150 යි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාලටයි මෙතුමන්ලටයි එක ගානට තමයි බෙදුවෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නෑ නෑ පොඩ්ඩක් ඉන්න ගරු සභාපතිතුමා. මම කියන්නෙ මේකයි. මේව සම්පූර්න වෙනස්කම් තුළ තමයි මේ වෙනස්කමක් වුණා. ඒකතමයි වුණේ. අනිත් එක මේකෙ බලන්න ලිං තිබ්ච්ච එක එකක්.හරි. අනිත් එක මේකෙ තියෙනවා බරපතලම එකක්. විගණකාධිපතිතුමිය තමයි මේක දීල තියෙන්නෙ. පිටු අංක 06 .05(1) නීති රීති රෙගුලාසි කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම. (ආ) යටතේ

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඔය විග්‍රහ කරන්නෙ මොකක්ද ඔය ලියුම

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

විගණකාධිපතිතුමා එවපු ඒවත් එක්ක මේ කියන්නෙ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හා හරි කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේක නිවැරදි කරගෙන අපි කොහොමද බජට් එකේ ඉස්සරහට යන්නෙ. ඒකයි කියන්නෙ මේ. ඒකෙ කියනවා රෙගුලාසි 395 (ආ) සභාවේ විදුලි බැංකු ගිණුම් මුදල් හා පරිසර ව්‍යාපෘති ගිණුම සඳහා බැංකු ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. අප දන්නා ගණකාධිකාරි ප්‍රභවයන්ට අනුව මෙම තත්ත්වයන් මගහරිමින් අයවැය ලේඛනයක් සමබර වන්නේ කෙසේදැයි ප්‍රශ්න කරන්නේ. මේව බැහැ මෙහෙම යන්න. මෙ තුළ තව තියෙනවා විශේෂයෙන්ම අපි මේක ප්‍රතික්ෂේප කරනවා.

අනිත් එක විවෘත බෙදීමකුත් අපිට ලබාදෙන්න කියල අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ගරුත්වයෙන්. ඒ සමගින් මේකෙ තියෙන කරුණු අපි පසුවට ඔබතුමාගෙ විරෝධතා ප්‍රතික්ෂේප කිරීමට හේතු අපි ඉදිරිපත් කරනවා. ඒක නිසා ඔබතුමා මේ අවස්ථාවෙදි මා ඉල්ලා සිටිනවා මේකට බෙදීමක් ලබල දෙන්න. බෙදීම සාධාරණ විදියට ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා මේක විවෘත බෙදීමක් හැටියට අපිට ලබාදෙන්න ඉතාමත්ම කරුණාවෙන්. අම්බලන්ගොඩ නගරයේ ජනතාව වෙනුවෙන් අපිට බොරුවට අත උස්සන්න බැහැ මේ අයවැයට. මිනිස්සු දැනගන්න ඕන මෙක මෙතෙන්ට ආවහම අපි ඔබතුමාට තව එකක් මං කියන්න ඕන. මටත් ඔබතුමා එක වෙලාවක කිව්වා මට තමුන්නාන්සේගේ තව වචනයකුත් කියලා කිව්වෙ මට එක විදුලි බල්බයක්වත් දාන්න ඉඩ තියන්නෑ කියල . මේක තමයි ඒකාධිපති පාලනය. ඒකාධිපති පාලනය තුලින් ඔබතුමා කළේ. ඒකාධිපති පාලනය තුළින් අපිව මට්ටු කරන්න කියල හැදුවා මන්ත්‍රීවරු. එහෙම කරන්න බැහැ. මේව අපි යන්න ඕන සහයෝගයෙන් ඒ යන විදියට යන්න ඕන.මොකද මහජනතාවගේ වැඩනෙ කරන්නෙ. මගේ පෞද්ගලික වැඩත් නෙමේ. ඒක නිසා කරුණාවෙන් මා ඉල්ලා සිටිනවා මේ අයවැය අපි ප්‍රතික්ෂේප කරනවා මා ඇතුලුව. මන්ත්‍රීවරුන්ගේ අත්සන් සහිතව පසුව ඉදිරිපත් කරනවා. මේක ප්‍රතික්ෂේප කරනවා. ඒක නිසා විවෘත බෙදීමක් දෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මම විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් අහගෙන හිටියා. මම නවක මන්ත්‍රීවරයෙක්. මම වැඩිදුර මේ නීතිරීති ගැන දන්නෙ නැහැ. මම බොහොම කෙටියෙන් අහන්නෙ අයවැය කෙටුම්පත් සාකච්ජාවක් තිබුණනෙ අපේ. ඒකෙදි මේ ඔක්කොම ඉදිරිපත් වුණා. එතනදි ඇයි මේවට විරුද්ධ වුණේ නැත්තෙ කියල මට ගැටලුවක් තියෙනවා. මම නවක මන්ත්‍රීවරයෙක් හැටියට මම ප්‍රශ්නයක් මතුකරනවා. මට තේරෙන්නෑ. ඇයි ඒකට කැමති වෙලා දැන් විරුද්ධ වෙන්නෙ කියලා. කෙසේවෙතත් ඔබතුමා ඉදිරිපත් කරපු අයවැයට අපි එදා සාතච්ජා කරල එකඟ වුණා. ඒ අනුව මං වැඩිදුර කතා කරන්න යන්නෙ නැහැ විශ්ලේෂණය කරන්න යන්නෙත් නැහැ. ඒ එකඟවීම උඩ මේ අයවැයට මමත් එකඟ වෙනවා. ජන්දයකට ගියොතින් මං පක්ෂව ජන්දය දෙනවා. මට තියෙන ගැටලුව අරක තමයි එදා එකඟ වෙලා ඇයි දැන් විරුද්ධ වෙන්නේ කියන එක තමයි මට තියෙන ප්‍රධාන ගැටලුව. ස්තූතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, 2018 වර්ෂයේ සිට අපි මන්ත්‍රීවරු 21කු අම්බලන්ගොඩ නගරය පාලනය කරන්න අපි මෙතනට ඇවිත් ඉන්නවා. දැන් මේ තුන්වෙනි අයවැය තමයි අපි ඉදිරිපත් කරන්නේ. මා දන්නේ නැහැ අද මොකක්ද මේ බෙදීමක් ඉල්ලන්නේ කියලා. තමන්ගේ මතිමතාන්තර , තමන්ගේ වාසිය තකා වැඩ කරන කොට එක එක්කෙනාට බෙදීමක් අවශ්‍ය වෙනවා. මේ අයවැය කෙටුම්පත සාකච්ඡා කරද්දී මට මේක කරන්න මට මේක කරන්න කියා  සියළු දෙනාම එක හඬින් කතා කරන කොට ඒ සියළු දේවල් මේ අයවැයේ තිබෙනවා.  ඒ අනුව එදා විරුද්ධ නොවී අද මේ කරන රඟපෑම මොකක් ද කියා මට නම් තෙරෙන්නේ නැහැ ගරු සභාපතිතුමනි. කිසිම පිළිකුළක් නැහැ මටනම් ඔබතුමා ගැන. පිළිකුළෙන් යුතුව කියා අද මේ කතා කළා සමහර මන්ත්‍රීවරු. කිසිම පිළිකුළක් නැහැ. බොහොම ප්‍රියතාවයයි ඔබතුමා. නගරයේ අපිට. මේවාට උත්තර දෙන්න ඕන. කවදාවත් මා විදියට කතා කරලා නැහැ. මා හිතුවා අද මා කතා කරනවා කියා. මේවා අහගෙන ඉඳලා හරි දුකයි. තමන් සියළු දේවල් කරගෙන, තමන්ගේ කොට්ඨාශයේ සියළුම දේවල් කරගෙන අද ඇවිත් කියනවා ඔබතුමා පිළිකුළයි කියා. අපිට වඩා දේවල් කර ගත්තේ ඔය කතා කරපු උදවිය. එතකොට දැන් කියනවා අපේ කොට්ඨාශයට වැඩ කෙරුණේ නැහැ කියා. අපිටත් කෙරිලා නැහැ තමයි. අපි මන්ත්‍රීවරු විදියට ඒ යෝජනා මෙතන අයවැයට දැම්මා නම්  අයවැයේ තිබෙනවා නම් තමන් ඇවිත් ඒවා කර ගන්න ඕන. සභාපති කියන්නේ අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන පුරවැසියා. සභාපතිතුමාට බැහැ අරක කළාද මේක කළාද කියා බලන්න. අපි උනාන්දු වෙන්න ඕන. මටත් කෙරිලා නැහැ. නමුත් මා අදටත් සභාපතිතුමාට දොස් කියන්නේ නැහැ. ඒක මාගේ වරදක්. ඒ හැර වැඩ කර ගන්නකොට කොට්ඨාශයේ මන්ත්‍රීවරයා කියා බේදීමක් තියෙනවා කියා දැන් කිවුවා. මේ කෙහෙල්මල ඉවර වෙනවා 2017 අංක 24 නගර සභා පණත අහෝසි කළාම . ඔය තියෙන හින මානය ඉවර වෙනවා. මේ හිනමානෙන් පෙලෙන්නේ. ඔච්චර අභියෝගයක් තිබෙන කට්ටිය දිනලා එන්න තිබ්බානේ මේ නගර සභාවට. මා මාගේ කොට්ඨාශය නොවන කොට්ඨාශයට ගිහිල්ලාත් මා දිනුවා. මාගේ ඡන්දයත් නැතුව. අපි අභියෝගයෙන් ජීවත් වෙන්නේ. බොරු පුරසාරම් ගහන්න ඕන නැහැ මේ අයවැයකට අල්ලා ගෙන. තමන්ගේ යටිහිතේ තිබෙන හිනමානය එළි දක්වනවා මේ නගර සභාවේ අයවැයට ඇවිල්ලා. මෙය 2017 අංක 21 දරණ නගර සභා සංශෝධන පණත නිසා තමයි මේ කෙහෙල්මල් පත් කිරිම ආවේ. කොට්ඨාශ 10ක් අපි දිනලා තිබෙන්නේ. ඒවා අහන්න හෙට අනිද්දා මේ සංශෝධන පණත අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉවත් කරනකොට ඔය කියන උදවිය කටවාගෙන ඉඳීවි. කෝ කොට්ඨාශ එගොල්ලන්ට. දෙන්න කොට්ඨාශ නැහැනේ. තමන්ගේ කොට්ඨාශය තමන්ට දිනා ගන්න බැරුව සභාපතිතුමාට මේ ඇඟිල්ල දික්

කරනවා.මේවා මේ කුණුහරුප. බලන්න දෙයක් නැහැ. ඔබතුමියට එකසිය ගණනක් මට කොච්චරක්ද ? බලන්න දෙයක් නැහැ. ඔබතුමියගේ ඡන්දෙත් එදා ඇතිව ඔබතුමියට එදා දිනන්න බැරිවුණා. මාගේ ඡන්දෙත් නැතුව මා මාගේ කොට්ඨාශය දිනුවා. ඔබතුමිය කොට්ඨාශය ගැන කතා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඊයේ රෑත් මට දුරකථන ඇමතුමක් ගෙන තිබුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගත්තේ එක තමයි. මොකද තත්ත්වය කියා අහන්න. අපි සභාපතිකමට පොර කන්නේ නැහැ. අපි ලේ වලින් අත්සන් කර දෙනවා. අපි සභාපතිකමට පොර කන්නේ නැහැ. අපිට හිනමානයක් නැහැ එහෙම. මට මේ පුටුව නැතු වුණාට මා ඔයිට වඩා හොඳ පුටුවක වාඩිවෙලා ඉන්නවා. දැන් එහෙම අභියෝග වලට මුහුණ දෙන්න බැරුව , ඡන්දය ඉල්ලන්නේ නැතුව , එක්කෝ ඡන්දය ඉල්ලා ඇවිත් පරාද වෙලා ඇවිත් ඔබතුමා වැඩ කළේ නැහැ. ඔබතුමා පිළිකුල් . දැන් මේ එක මතක් වලා ඇවිත් තිබෙන්නේ වසර තුනක් ගියතැන. දැන් ද ඔබතුමා පිළිකුල් වෙලා තිබෙන්නේ. මේක මතක් වෙන්න එපැයි 2017 ආපු ගණන්. තමන්ගේ කොට්ඨාශයේ සියළු වැඩ මේ සභාපතිතුමා කරලා තිබෙනවා. කියපු හැම දෙයක්ම කරලා තිබෙනවා. ඇත්තටම අපි තමයි මන්ත්‍රිවරු. අපි කොට්ඨාශයේ ජනතාවගෙන් ජයග්‍රහණය කරලා ආවේ. අපි බය නැතුව කෙයිනවා. අපි පිං මන්ත්‍රිවරු නෙමේ. අනික මේ පෞද්ගලික ප්‍රශ්න මේ සභාවට අදාල කර ගන්න එපා. මා මේ කියන්නේ මාගේ පෞද්ගලික ප්‍රශ්නය කියා. දැන් අයාරාංගනී මන්ත්‍රිතුමිය ඔබතුමාට ඇඟිල්ල දික් කරනවා. එතුමියගේ නිල සෙවණ හදනකොට අපි එතුමියත් සමඟ අපි එතන හිටයා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නැහැ . මට සමස්ත මන්ත්‍රිවරු උදවු කළේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

සමස්ත මන්ත්‍රිවරු කියන්න එපා. අපි හිටියා. සභාපතිතුමා හිටියා. එතන ස්ථානයටත් ගියා බලන්න. එහෙම කතා කරන්න එපා. එහෙම කතා කරන්න එපා තමන්ගේ පෞද්ගලික දේවල් තකා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නිල සෙවණ කියන්නේ මාගේ පෞද්ගලික දෙයක් නෙමේ. පොදු දෙයක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එහෙනම් කිවුවේ සභාපතිතුමා කළේ නැහැ කියා සභාවට . එතුමා ගියා එතනට. ඔබතුමියට රාහුල මන්ත්‍රීතුමා විරුද්ධ වෙනකොට අපි ඔබතුමියත් එක්ක එදා හිටියේ. කතා කරන්න එහෙම. හිතට එකඟව කතා කරන්න. දැන් මාගේ කොට්ඨාශයට වැඩ කරන්න මට ප්‍රතිපාදන ලැබුණාට මට වැඩියේ වැඩ කරන්නේ මෙතුමිය. මා කිසි දිනයක ආරවුලක් ඇති කරගෙන නැහැ. ලක්ෂ 20 ආවාම සපිරි ගමක් යටතේ එතුමියට ඕන කිවුවාම මා එතුමියගේ නිවස ළඟ පාරට දුන්නේ එතුමියට. ඇයි මේ විදයට බෙදීම් ඇති කර ගන්න කියන්නේ මේ අයවැයේ. කිසිම බෙදීමක් ඕනේ නැහැ. ඒ හැර දැන් මේ අපේ ධම්මික මන්ත්‍රීතුමා කිවූ පරිදි 2020.11.17 අයවැය කෙටුම්පත් වාර්තාව සම්මත කළානම් එකඟ වුණානම් 178 පිටුවේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමිය මා පැහැදිලි කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ඒ සම්බන්ධයෙන් අපේ නගර සභා ආඥා පණතේ කොහොමද සම්මත වෙන්නේ කියා තෙරෙනවා. නැතිනම් අකුරු දන්නේ නැතිනම් එකත් කියවා බලන්න. කොහොම නමුත් කිසිම බේදීමක් නැහැ. මාගේ පූර් ණ සහායෝගය දක්වනවා. පොඩි පොඩි අඩුපාඩුකම් අපි කවුරු අතරත් තිබෙනවා. මටත් සමහර වේලාවට මොනවා හරි කිවුවාම දුරකථනයෙන් මොනවා හරි කිවුවාම දොස් කියන අවස්ථා තිබෙනවා. නමුත් ඒ පෞද්ගලික ප්‍රශ්න නෙමේ මෙතනට අදාළ. මා උප සභාපතිතමා සමඟ පෞද්ගලික ප්‍රශ්නයක් තිබෙනවා කියා . එක් නෙමේ. මේ අයවැය කියන්නේ අම්බලන්ගොඩ නගර සභාව නගරයේ ජනතාව වෙනුවෙන් කරන දෙයක්. මා එක එක්කෙනා සමඟ තිබෙන පුද්ගලික ප්‍රශ්න මා මෙතනට ගාව ගන්නේ නැහැ. සභාපතිතුමා මට දුරකථනයෙන් බැන්නාය. මාගේ වැඩය කළේ නැහැ කියා. දැන් ගේ ඉදිරිපිට මාගේ කාණුව තවම කෙරිලා නැහැ. නමුත් එක මේකට අදාළ නැහැ. මේ කියන්නේ අයවැය. අපි මෙතන බැන ගන්න එක මොනවා හරි කියන එක පෞද්ගලික කතාවක් . ඒක වෙනම දෙයක්. මා ඉල්ලන්නේ මන්ත්‍රීතුමියගෙන් මොනවා හරි දෙයක් පෞද්ගලිකව. මේක අයවැයක්. අයවැය කියන්නේ අම්බලනේගාඩ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කරන දෙයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. එමනිසා මා කරුණාවෙන් කියනවා මේකට මේ කිසි දිනයක මේ පෞද්ගලික දේවල් ගාව ගන්න එපා. අපි පිං මන්ත්‍රීවරුයි අපි නිලලත් මන්ත්‍රීවරුයි ඒ කතා මෙතනට වැඩක් නැහැ. මේක අයවැයක් . මිනිසුන්ගේ පොදු යහපත තකා ඉදිරිපත් කරන ලද දෙයක්. අනික ඔය සතියේ කතාවට දැන් කතා කළා. අපේ කොට්ඨාශයට කෙරිලාම නැහැ. නමුත් මුකුත්ම නැහැ. අපිට හොඳටම පෙනෙනවා.

අපේ ඇස් තිබෙනවා. මේ නගර සභාවේ මේ ගොඩනැඟිල්ල මේ දැන් හදනවා. ඉතිං අපි එක තේරුම් ගන්න ඕනේ. යම් යම් කැපකිරීම් කරන්න ඕන යම් යම් දේවල් ලබා ගන්න. අයිතිවාසිකම් ඉල්ලන්න යුතුකම් කර තිබෙන්න ඕන. මා යුතුකම් නොකර කෙනෙකුගෙන් අයිතිවාසිකම් ඉල්ලන්න බැහැ. තනතුරු ඉල්ලන්න බැහැ. යුතුකමක් නොකර . එතකොට හොඳටම පෙනෙනවා මේ කම්කරුවන් නගර සභාවේ මේ ගොඩනැඟිල්ලේ මේ වැඩ කරනවා කියා . එක නිසා අපි එකත් උපේක්ෂාවෙන් ඉවසාගෙන ඉන්න ඕන. මේ මිනිසුන්ට වුණත් කියන්න ඕන මේ නගර සභා ගොඩනැඟිල්ල දැන් කඩාගෙන වැටෙනවා එක නිසායි කියා. තමන්ගේ පෞද්ගලික දේවල් මේ අයවැයට යොදා ගැනිම ගැන මාගේ බලවත්ම කනගාටුව ප්‍රකාශ කරනවා. කෙසේවෙතත් 2021 වර්ෂයේ අයවැය මහ අම්බලන්ගොඩ ග්‍රාමයේ කෙරෙන්න ඕන සියළු දේවල් අන්තර්ගත වෙලා තිබෙනවා. අපේ ග්‍රාමයට කරන්න ගොඩක් දේවල් නැහැ. ලක්ෂ 20 ආවා. එකෙන් සියළු දේවල් කළා. ඒ හැර ගරු වෛද්‍ය රමේෂ් පතිරණ අමාත්‍යතුමා ලක්ෂ 05ක් එවා එයිනුත් අපි පාරක් කළා. අපේ කොට්ඨාශයේ කිසි ප්‍රශ්නයක් නැහැ. මා කොට්ඨාශයේ ඡන්දෙන් දිනලා ආ මන්ත්‍රිවරිය විදියට මා කියනවා. මාගේ සම්පූර් ණ සහායෝගය මේ අයවැයට දෙනවා. අයවැයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන්නේ ඔබතුමා සමඟ වත් මේ කිසිම කෙනෙකු සමඟ තිබෙන පෞද්ගලික අමනාපකම් නිසා වත් නොවේ. මේ අයවැය අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ සුභ සිද්ධිය තකා සකස් කරන ලද අයවැයක් නිසා තමයි මා මෙයට සහායෝගය දෙන්නේ. මෙය පෞද්ගලික මාගේ කරට ගන්නේ නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ අයවැයේදි මා හිතන්නේ මෙතන බෙදිමක් ඉල්ලා කතා කළේ විරුද්ධ පක්ෂයේ අය. ඒ අයවැයට බෙදිමක් ඉල්ලා කතා කරපු අය තමයි අද වැඩියෙන්ම ප්‍රයෝජන අරගෙන තිබෙන්නේ. ඔබතුමාගෙන්. ඔබතුමාගේ ගුණ වර්ණා කළා පසුගිය වකවානුවලදි. මා හිතන්නේ මේ ඔබතුමා මේ තනතුරෙන් ඉවත් කරන්න කරන කුට ව්‍යාපරයක් මේක. අපි දකින්නේ . එහෙම නම් මේ කෙටුම්පත ඉදිරිපත් කරන වේලාවේදි මෙකට විරුද්ධව නැගි සිටින්න ඕන. ප්‍රකාශ කරන්න ඕන. අදහස් ඉදිරිපත් කරන්න ඔන. ඒ කිසිම මන්ත්‍රිවරයෙක් ඒ කෙටුම්පතේදි අදහස් දැක්විමක් විරුද්ධ විමක් දැක්වුයේ නැහැ. ගරු සභාපතිතුමනි මා මේ අවස්ථාවේ පැහැදිලි කිරිමක් කරන්න ඕන. හලාවත නගර සභාවේ අයවැය

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා මාගේ කතාවේදි මා එක කියන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මටත් එය කියන්න අවසර දෙන්න.ඔබතුමාත් කියන්න. ඔබතුමා මට වැඩියේ පැහැදිලි කරයි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එක නෙමේ . ඔය තත්ත්වය පිළිබඳ මා පැහැදිලි කරන්නම්. දැන් කරන්න එපා. පසුව අවස්ථාවක් දෙන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

මා කියන්න ආවේ මෙතන අයවැය පරාජය කළත් මේ ද්වේශසහගතව ඔබතුමාට කුමන්ත්‍රණය කරලා ඔබතුමා මේ තනතුරෙන් ඉවත් කිරිමට කටයුතු කිරිම මිසක් වෙන කිසිම මේ අයවැයේ තිබෙන දෝෂයක් නෙමේ. පැහැදිලිව පෙනෙනවා. මේ අයවැය පරාජය කළත් සභාපති ධූරය වෙනස් නොවන බවත් පැහැදිලියි. මේ සභාව මේ විදියටම ගෙනියන බවත් පැහැදිලියි. මා කියන්න ආවේ . හලාවත නගර සභාවේ බලය තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයට. එතකොට එහි පළාත් පාලන මන්ත්‍රිවරු වශයෙන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රිවරු 7කු තෙරුණා. ශ්‍රි ලංකා නිදහස් පක්ෂයෙන් මන්ත්‍රිවරුන් 06කු තෙරුණා. පොදුජන පෙරමුණේ මන්ත්‍රිවරු 6කු බිහි වුණා. ජනතා විමුක්ති පෙරමුණෙන් එක මන්ත්‍රිවරයෙකු බිහි වුණා. එතකොට මේ එක්සත් ජාතික පක්ෂයේ හලාවත නගර සභාවේ බලේ ලබා ගත්තේ ශ්‍රි ලංකා නිහදස් පක්ෂයේ මන්ත්‍රිවරු 6නාත් එක්සත් ජාතික පක්සයේ මන්ත්‍රිවරු 7ත් එකතුවෙලා තමයි ඒ අවස්ථාවේදි. දැන් මේ දෙසැම්බර් මාසයේ මේ අයවැය ඉදිරිපත් කරද්දි අර ශ්‍රි ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රිවරු 6නාත් පොදුජන පෙරමුණේ මන්ත්‍රිවරු 6නාත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරයාත් යන ඒ 13 එකතුවෙලා මේ අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා. ඡන්දය ප්‍රකාශ කළාට එක්සත් ජාතික පක්ෂයට ඡන්ද 6. අරකට ඡන්ද 13යි. එක්සත් ජාතික පක්ෂයේ එක මන්ත්‍රිවරයෙක් පැමිණ සිටියේ නැහැ ඒ අවස්ථාවේ.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා මා ඔබතුමාට පොඩ්ඩක් කතා කරන්න දෙන්නම්. විනාඩි 05කට සභාව කල් තියෙනවා.

- **පෙරවරු 10.40 ට පමණ ගරු සභාව කල් තබන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාව නැවත ආරම්භ කරනවා. ධර් මදාස මන්ත්‍රිතුමා කතා කරන්න.

- **පෙරවරු 10.45 ට පමණ නැවත සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ මා කියාගෙන ආවේ ඒ හලාවත නගර සභාවේ ඒ බලය ගිහිපු හැටි . නමුත් ඒ කරුණු ඉදිරියට ඔබතුමාට පැහැදිලි කරන්න පුළුවන් වෙයි. මෙතන අද යම්කිසි කුමන්ත්‍රණයක් දියත් වෙච්ච බවයි මාගේ අදහස. ඔබතුමා මෙතන ද්වේශසහගත ලෙස මේතනින් ඉවත් කිරිමේ වැඩපිළිවලක් තමයි මෙතන දියත් වෙන්නේ. අපි දන්නවා මෙතන මේ වැඩපිළිවල යනකොට . මෙතන මන්ත්‍රිවරු කතා වුණේ ලැයිස්තුගත මන්ත්‍රිවරු කියා . අපිට එහෙම දෙයක් හැඟුනේ නැහැ. වැඩ කිරිමේදි අපි දන්නවා ඔබතුමා ඒ හැම අයටම සහායෝගයෙන් වැඩ කළා. නමුත් අද මේ අය බලාපොරෝත්තු වෙන්නේ ඔබතුමා මේ නිලයෙන් පහ කරලා බලය ලබා ගැනීමේ කුමන්ත්‍රණයක්.  නමුත් එක කවදාවත් ඉෂ්ඨ වෙන්නේ නැහැ. ඒ අය මොන විදියට ඡන්දය පාවිච්චි කළත් අපිට ඡන්ද අඩු වුණත් ඒ අයට ඡන්ද වැඩි වුණත් ඒ කර් තව්‍ය ඉෂ්ඨ වෙන්නේ නැහැ කියන එකයි මා මෙතන ප්‍රකාශ කරන්නේ. මා අර නිත්‍යානුකූල තත්ත්වය පැහැදිලි කරන්නේ නැහැ. ඔබතුමා එක පැහැදිලි කරන නිසා. එය මා පසුවට පැහැදිලි කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා   කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, 2021 අයවැය. මා මේ සහභාගි වෙන 12 අයවැය. අපේ සමහරක් මන්ත්‍රිවරු කිවුවා විශේෂයෙන් විපක්ෂයේ මන්ත්‍රිවරු කිවුවා තමන්ගේකොට්ඨාශ වල වැඩ කෙරිලා නැහැ කියා. ඇත්තටම කනගාටුයි එවැනි ප්‍රකාශ කිරිම ගැන. පාලක පක්ෂයේ මන්ත්‍රිවරුන්ට වඩා එතුමන්ලාගේ ග්‍රාම සේවක වසම් වල වැඩ කෙරිලා තිබෙනවා. මා වැඩියේ විවෙචනය කරන්නේ නැහැ. මොකද අපේ ලක්ෂ්මී මන්ත්‍රිතුමිය කියන්න ඕන ටික කිවුවා. එමනිසා මේ 2021 අයවැය ඉතා සාර් ථක කර ගැනීමට ඔබට හැකිවේවායි පතන ගමන් ගරු සභාපතිතුමා මන්ත්‍රිතුමන්ලා තුමියන්ලා ඇතුළු සියළුම කාර්ය මණ්ඩලය මහන්සිවෙලා හදපු මේ අයවැයට එතුමන්ලාට ස්තුතිය පුදකරමින් 2021 වර් ෂය ඔබ සියළු දෙනාටම නීරෝගිමත් නව වසරක් වේවායි පතනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තවත් මන්ත්‍රීවරු කතා කරන්න අවශ්‍යද ?

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, පුරවැසි දනගේ සේවා ඉටුකොට විශිෂ්ඨ නගරය කරලමු මිහිපිට යන සුභවාදි දෘෂ්ටියෙන් යුක්තව පවත්වාගෙන යන අම්බලන්ගොඩ නගර සභාවේ ඒ ජයග්‍රාහි තවත් අයවැයක් පිළිබඳව ප්‍රසාදාත්මක හැඟීමයි මාගේ මතය. ඒ ගැබිනි මවුවරුන් මුහුණ දෙන ඒ අභියෝගාත්මක මොහොතේ පවා සුවිශාල මෙහෙවරක් ඉටු කරමින් අකුරු කරන දුවා දරුවන්ට පතපොත ලබා දෙමින් අඛණ්ඩව එපමණක් ද නොවේ. අපේ ග්‍රාමීය ප්‍රදේශවල ඒ සංවර්ධන යෝජනා ක්‍රියාවට නංවාලමින් මේ නගර සභාව ඒ ජයග්‍රාහි ගමනක් යන මොහොතේ නිතිඥ අරුණ ප්‍රදිප් යන ඔබතුමාගේ නායකත්වයෙන් ඉදිරිපත් කරන මා හිතන්නේ 12වැනි අයවැයටයි අපි ප්‍රවිශ්ඨ වි සිටින්නේ. ඔබතුමා තවත් ප්‍රජාතන්ත්‍රවාදි මගකට පිවිසෙමින් ඒ ජනතාවගේ යෝජනා ලබා ගනිමින් ඒ ග්‍රාමයන්ගේ වැසියන්ගේ අදහස් වලටත් මුලිකත්වය දෙන වැඩ සටහනක් ආරම්භ කළා. මා හිතන්නේ ඇතැම් විවිධ දූර්මතත් ප්‍රකාශ වුණා. ඒ සියල්ල ඉටු කර ගැනීමට නොහැකි වූ බවට. නමුත් අපි අපේ මා ජීවත් වන කෙරම්ණිය පින්නදූව බල ප්‍රදේශයේ ඒ ඉදිරිපත් වූ යෝජනා වලින් මට හැකිවුණා යෝජනා 8කට 9කට ආසන්න සංඛ්‍යාවක් ක්‍රියාවට නංවාලන්නට. එහි ප්‍රධානම යුතුකම ඉටු කරන්න සිදු වුයේ මහජන නියෝජිත වරයා හැටියට මටයි. මේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය යටතේ මෙවන් සභාවක ඉදිරිපත් වන යෝජනා ඉටු කර ගන්නට නම් නියෝජිතයා ක්‍රියාවට ක්‍රියාත්මක විය යුතුමයි. නොඑසේ නම් මෙහි යෝජනා ස්ථිරත්වයෙන් සම්මත විමෙන් නම් අපිට මේවා යථාර් ථවාදි බවට පත්කර ගැනීමට නොහැකි වෙනවා. එමනිසා අපේ මහජන නියෝජිතයන් බොහෝ දෙනා මේ යෝජනා සම්මත කරගෙන ගෙදරට වෙලා ඉඳලා හරියන්නේ නැහැ. ඔබතුමා සමඟ කතිකා කරලා ඔබතුමලාට ඒ යෝජනා ඉටු කරගැනීමට හැකි වෙන්නේ. විගණන විමසුම් ගැන කියවුණා. නිතිඥ අරුණ ප්‍රදිප් පාලනයට පමණක් එන ඒවා නෙමේ විගණන විමසුම්. එදා මහලොකු වීරයන් යයි කියා කිවු නායකයන්ට පවා සෑම වර් ෂයකම ඒ විගණන විමසුම් ලිපිගොණු මිටි ආවා. අදත් එහෙමයි. අනාගතයේත් එහෙමයි. අපි කියනවා ඉතාම යහපැවැත්මෙන් යුක්තව යහ සංකල්පනාවෙන් යුක්තව ඉදිරිපත් කළ මේ අයවැයට ඉදිරි වර් ෂය සාර්ථකව ගෙන යාමට හැකිවේවායි පතනවා. මේ වන විට එදා සිහිනයක්ව පැවැති අපේ අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණය ඔබතුමා යථාර්ථයක් කර හමාරයි. එපමණක්ද නොවේ. කිලෝමීටර් 20 ගණන් 30 ගණන් මාර් ග කාපට් වෙන්න පටන් අරගෙන අපේ ගම් ප්‍රදේශ කලඑලි වෙද්දි බොහෝ දෙනාට මේවා දකින්නට අපහසු වෙලා. එමනිසා පිළිකුල් වේගන යනවා. උගත්

බුද්ධිමත් සැබෑ නායකයෙක් හැටියට ඔබතුමා ඉදිරිපත් කළ අයවැයට ප්‍රසාදය පල කරමින් කෙරමිණිය , පින්නදූව ජනතාවගේ ප්‍රසාදය පුද කරනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තවත් මන්ත්‍රිවරු කතා කරන්න ඉන්නවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. නොයෙකුත් යෝජනා පක්ෂ විපක්ෂව කතා කෙරුණා. ඇත්තටම මා මුලින්ම කතා කරනවා. ඔබතුමා ඉදිරිපත් කර තිබෙන අයවැයට ප්‍රථමයෙන් මාගේ විරෝධතාවය පල කරනවා. ඒ වගේම මා මේ අයවැය ප්‍රත්ක්ෂේප කරනවා. 2021 අම්බලන්ගොඩ නගර සභාව විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛණයට අනුව ආදායම් ශිර් ෂය . මෙහි පුනරාවර්තන ආදායම තිබෙනවා 182,156,957

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමිය පිටුව කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය  කතා කරමින්</u>**

33 පිටුව. ඒ වගේම ප්‍රාග්ධන ආදායම රු.2,501,000 කි. මෙහි සමස්ත ආදායම රු.184,657,957කි. මෙය ප්‍රතිශතයක් විදියට ගත්තාම පුනරාවර්තන ආදායම 98.46%, ප්‍රාග්ධන ආදායම 1.54% කි. ඒ වගේම වියදම් ශිර් ෂය යටතේ පුනරාවර් තන වියදම 155,385,870, ප්‍රාග්ධන වියදම තිබෙනවා රු.29,221,000 ක්, සමස්තවියදම රු.184,606,879 ක් මෙය සියයට ප්‍රතිශතයක් විදියට ගතහොත් පුනරාවර්තන වියදම 84.17% ක් ප්‍රාග්ධන වියදම 15.83% කි. මෙහි ආදායම් වියදම් අතිරික්තය බැලුවාම රු.51,087කි. එතකොට මේ පුනරාවර්තන ආදායම දිහා අපි සලකා  බැලුවාම වරිපණම් බදු තිබෙනවා රු.24,090,000, කුලි රු.21,329,000, බලපත්‍ර ගාස්තු තිබෙනවා රු.1,273,000, සේවා සඳහා ගාස්තු 17,995,000, වරේන්තු ගාස්තු හා දඩ මුදල් රු.511,000 ,එතකොට පුනරාවර්තන අදායම වශයෙන් මේ ටික එකතු කළාම රු.65,198,000මෙය සියයට ප්‍රතිශතයක් වශයෙන් බැලුවාම 35.31% ක්. එතකොට මේ ප්‍රදේශයේ ජනතාවගෙන් බදු ගාස්තු , කුලී,ඒවාගේ දේවල් වලින් 2021 වසරේ අපේක්ෂිත ආදායම රු. රු.65,198,000. එතකොට මේක සභාවේ සමස්ත ආදායමෙන් 35.51% කි. එතකොට මෙන්න මේ මෙච්චර මුදලක් ජනතාව මත බදු බර පටවමින් ලබාගෙන පෙරළා ජනතාවට සාධාරණයක් ඉටු වෙනවාද කියන ප්‍රශ්නය මා මොහොතේ අසනවා. එකත් එක්ක මා මේ අයවැයට විරුද්ධ වෙනවා. ආදායම් ආධාර

රු.83,391,000 ක් ඊට පස්සේ විවිධ ලැබීම් යටතේ තිබෙනවා රු.33,567,957ක් මේවා රජය මඟින් ලැබෙන ආධාර. ඒ අනුව මෙන්න මේ අයවැය ලේඛණයට අනුව අපිට පැහැදිලි වෙනවා නගර සභාව විසින් ජනතාවගේ බදු, කුලී, ගාස්තු , දඩමුදල් ඒවාගේ දේවල් වලින් ලැබෙන හා රජයෙන් ලැබෙන ආධාර හැරෙන්න ස්වයං උත්පාදන වැඩ සටහන් ක්‍රියාත්මක වෙලා තිබෙනවාද? ස්වයං උත්පාදන වැඩ සටහන් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වගේම නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වෙලා ඒ වගේම මහජනතාවත් ඊට සම්බන්ධ කරගෙන රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වෙලා නැහැ. එහෙම හැකියාවක් පෙන්නුම් කරලා නැහැ. ඉතිං අන්න එකනිසා මේ කොරෝනා වසංගතයක් හමුවේ ජනතාව මත බදු බර පටවමින් රජයෙන් ආධාර මුදල් පමණක් ලැබෙනකම් ඇත්තටම අපිට පුළුවන්ද බලාගෙන ඉන්න. ඒ වගේම නගර සභා බල ප්‍රදේශයේ සංවර් ධන කටයුතු වෙනුවෙන් මුලධන ලැබීම් විදියට ලැබෙන්නේ ඊ.2,501,000 ක මුදලක් .එතකොට මෙය සමස්ත ආදායම් ශීර්ෂයෙන් 1.54 ක ප්‍රමාණයක්. අන්න එකනිසා මෙයින් පැහැදිලි වෙනවා නේද ? මෙයින් පැහැදිලි වෙනවා මෙය ප්‍රදේශයේ සංවර්ධනයට ජනතාවගේ සංවර් ධනයට දායකත්වයක් ලබා දි නැහැ කියන එක. අන්න ඒ නිසා මා අහනවා ඔබතුමන්ලාගෙන් මේ අයවැයට අපිට එකඟ වෙන්න පුළුවන්ද ? කියන ප්‍රශ්නය. එමනිසා මේ අයවැය මා ප්‍රතික්ෂේප කරනවා මාගේ විරෝධතාවය. මා මේ විරෝධතාවය දක්වන්නේ කිසි කෙනෙකුගේ පෞද්ගලික දෙයක් වෙනුවෙන් නෙමේ. මා මේ විරෝධතාවය දක්වන්නේ පෞද්ගලිකව ඔබතුමාට එහෙම නෙමේ. මාගේ විරෝධතාවය සමස්ත පොදු විරෝධතාවයක්. එතකොට වියදම් ශීර්ෂය දිහා බැලුවොත් පුනරාවර්තන වියදම් විදියට තිබෙනවා ඊ.155,385,870 ක් මෙහි සියයට ගණනක් ප්‍රතිශතයක් විදියට ගතහොත් 84.17% මෙන්න මේක පුනරාවර් තන වියදම් මේ යටතේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම, ලේකම්තුමිය, නිලධාරි මණ්ඩලය, සේවක දීමනා,වැටුප් , පරිතෝෂිත දීමනා,ප්‍රතිලාභ , ඉන්ධන , දුරකථන දීමනා ඔය සියල්ලෙම එකතුවක් තමයි මේ. එතකොට ඒ සඳහා 84.17% ක ප්‍රමාණයක් වියදම් කරද්දි නගර සභාව විසින් නගර සභා බල ප්‍ර දේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් මා මේ ටික කියන්නේ මේ අයවැය ලේඛණයට අනුව නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් විදියට රු.29,221,000 ක් පමණයි මේ අයවැය ලේඛණයේ වියදම් කිරිමට බලාපොරෝත්තු වෙන්නේ. ඒ කියන්නේ 15.83% ක සුළු මුදලක්. එහෙම නම් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ 2021 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ මන්ත්‍රීවරු , නිලධාරින් , සේවකයින් , ගොඩනැඟිලි , වාහන , උපකරණ ඔය ආදි දේ ගත්තාම 84.17% ක් වියදම් කරද්දි ප්‍රදේශයේ සංවර්ධනයට වියදම් කරන්නේ 15.83% ක ප්‍රමාණයක්. අන්න ඒ නිසා මේ අයවැය ලේඛණයට අනුව මෙකට අපිට

එකඟ වෙන්න පුළුවන්ද කියන එක. මෙකට එකඟ වෙන්න අපිට බැහැ. ප්‍ර දේශයේ සංවර් ධනයට 29,221,000 ක් වියදම් කර තියෙද්දි කොට්ඨාශයකට අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ තිබෙනවා 13ක් තිබෙනවා. එතකොට ඒ කොට්ඨාශයකට ලැබෙන්නේ මා මෙතන කියනවා වැරදි නම් නිවැරදි කරන්න. ඒ කොට්ඨාශයකට ලැබෙන්නේ ලක්ෂ 12ක් පමණයි. එහෙම නම් මෙන්න මේ ලක්ෂ 12 ප්‍රමාණයෙන් අපිට පුළුවන්ද ප්‍රදේශයේ ජනතාවට මේ සේවය කරන්න. ප්‍රදේශයේ ජනගහණය මා මෙතන සටහන් කර ගෙන තිබෙන්නේ 26938ක් නමුත් එය අයවැය ලේඛණයට අනුව 27068 ක්. එහෙම නම් මෙන්න මේ 29,221,000 අපි සමස්ත ජනගහනයෙන් බෙදුවොත් එහෙම 2021 වසර වෙනුවෙන් මේ අයවැය ලේඛණයට අනුව බල ප්‍රදේශයේ ජනතාවගෙන් එක පුද්ගලයෙකුට අපි වියදම් කරන්නේ 2.97ක් රු.3/=ක් වගේ . මා අහනවා ඔබතුමලාගෙන් අපි මන්ත්‍රිවරු විදියට පත්වෙලා ඉන්නේ නගරයේ ජනතාවට සේවය කරන්න. අන්න එකනිසා ගරු සභාපතිතුමනි, අපි මීට වඩා අපේ ජනතාව වෙනුවෙන් හිතන්න ඕන. අපි මෙතන වාඩිවෙලා ඉන්නේ අපේ මිනිසුන් කියක් හරි අපිට ඡන්දය දිපු නිසා. අන්න එකනිසා ජනතා සුබ සාධනය  වෙනුවෙන් , ජනතා සංවර්ධනය වෙනුවෙනුයි අපි වැඩ කටයුතු කරන්න ඕන. එමනිසා ඔබතුමා සමඟ කිසිම අමනාපයක් නැහැ. මා මේ ඉදිරිපත් කරන්නේ මට තෙරේන විදියට දකින දේ ඒ නිසා මා අහනවා මේ අයවැයට හෘද සාක්ෂියට අනුව අපිට එකඟ වෙන්න පුළුවන් ද කියන එක. අනිත් එක තමයි වැදගත් දේ ඔබතුමලාගේ පක්ෂේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඔබලාගේ පක්ෂේ, අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමත් ඔබතුමලාගේ පක්ෂේ, කැබිනට් මණ්ඩලයත් එහෙමයි. ඒ වගේම දැන් තිබෙනවා 2/3 බලයක්. මෙච්චර මේ සියළු සුදුසුකම් සපුරා දි තියෙද්දි ජනතාව විසින් ඒ නිසා මා අහනවා තවත් මොනවාද වැඩ කරන්න තිබෙන අඩුපාඩුකම්. එමනිසා මා කියනවා මාගේ යෝජනාවෙන් අවංකවම ඇත්තටම අපේ ජනතාවට සේවය කරන්න ඕන. ඉතිං ඒ නිසා මේ පිළිබඳව ඔබතුමන්ලා හිතන්න. මා මේ අයවැයට විරුද්ධ වෙන්නේ මා දන්නා තරමින් මා මේ ඉදිරිපත් කරපු හේතු කාරණා නිසා. එමනිසා නැවත වතාවක් මා මේ අයවැයට විරුද්ධ බව ප්‍රකාශ කරමින් මේ අයවැය ප්‍රතික්ෂේප කරන බව පවසමින් බෙදිමක් ඉල්ලනවා .

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අදහස් දක්වපු නැති තවත් මන්ත්‍රිවරු ඉන්නවාද? අදහස් දක්වන්න ඉන්නවාද තවත්. සෝභිත මන්ත්‍රිතුමා , නැහැ. එතකොට පේෂලා මන්ත්‍රිතුමිය කතා කරනවාද ? නැහැ. කවුද අපේ ඉනෝකා මන්ත්‍රිතුමිය කතා කරනවාද ? නැහැ. අපේ ධනසේන මාදුවගේ මන්ත්‍රිතුමා කතා කරනවාද ?

අසනීපයි. එතකොට ලසන්ත මන්ත්‍රීතුමා කතා කරනවාද ? අවශ්‍ය නැහැ. අපේ රාජපක්ෂ මන්ත්‍රීතුමා . නැහැ. කතා කළා, කතා කළා, සරත් මන්ත්‍රීතුමා කතා කරනවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කරන ලද 2021 සඳහා වූ අයවැය පිළිබඳව විවාදයේදි පාලක පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් විදියට මේ අයවැයට සම්බන්ධවන මොහොතේ මං මතක් කරන්න කැමතියි ශ්‍රී ලංකා ප්‍රජතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් , අගමැතිතුමන් ඇතුළු ආණ්ඩුව විසින් පාලනය කරනු ලබන ශ්‍රී ලංකාව තුළ අපි නගර සභාවක් විදියට පාලක පක්ෂයේ නගර සභාවක් විදියට රජයක් බලාපොරෝත්තු වෙන්නේ මොන ආකාරයේ සුබ සාධනයක් ඒ නගරයේ පාලනය කරන නගර සභාවක් විසින් ජනතාවට සපයා දෙනවාද කියන එක ගැන. මොකද අපි මොන වාද විවාද කළත් රජයක් විසින් තමයි නගර සභාවේ වැඩිම බර දරන්නේ. ඒ මූල්‍යාධාර ප්‍රතිපාදනය කරනවා 54% ක් වැටුප් ප්‍රතිපූර්ණ යටතේ . මේ නගර සභාවේ සියළුම සේවකයන් සඳහා වැටුප් ගෙවනු ලබන්නේ රජයෙන්. පොදු මහජනතාවගේ බදු මුදලින්. මේ පොදු මහජනතාවගේ බදු මුදලින් ගෙවලා වැටුප් ලබලා අපි ජනතාවට සේවයක් ලබා දෙනවිට රජයක් විදියට විශේෂයේනම අතිගරු ජනාධිපතිතුමන් බලාපොරෝත්තු වන්නේ මේ රටේ ජනතාව සුඛිත මුදිත විදියට යහපත් ජිවන තත්ත්වයක් උදාකර දෙන විදියටයි. අවාසනාවන්ත ලෙස කොවිඩ් වසංගතය වේලා ගත්තාත් එතුමන් අප්‍රිතයික ධෛර් යෙන් යුතුව මේ රට පාලනය කරමින් සිටිනවා. විශාල බාධක තිබෙනවා. ඒ බාධක අස්සේත් මේ රට මේ ආකාරයෙන් පාලනය කිරිම ජනතාවට යම් යම් පොඩි අපහසුතා වුණත් ජනතාව කල්පනා කළ යුතුව තිබෙනවා මෙවැනි තත්ත්වයක් යටතේ යුරෝපා කරයේ ඇමරිකාවේ හෝ වේවා මැද පෙරදිග හෝ වේවා සෞඛ්‍ය හේතුන් මත සෞඛ්‍ය පහසුකම් නැතුව කොවිඩ් තත්ත්වයෙන් පාරවල් වල මැරි වැටෙන ජනතාව අනත්තයි. අසරණයි. දියුණුයි කියන ඉන්දියාවේ ලක්ෂ ගණන් පාරවල් වල සමහරු මිය යන්නේ. වාසනාවකට ලංකාවේ අපේ ගරු ජනාධිපතිතුමාට පිංසිද්ධ වෙන්න. එතුමන්ලාගේ දූර දර්ශි වැඩ පිළිවලවලට පිං සිද්ධ වෙන්න අපේ මිනිසුන්ට අඩුම වශයෙන් රෝහලක් තිබෙනවා. බෙහෙත් ටික තිබෙනවා. අවම වශයෙන් මේ මරණ සිමා කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. රටේ වර්තමාන තත්ත්වය මෙයයි. එතකොට රජයක් විදියට මේ නගර සභාවෙන් මේ නගරයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවා ලිමට වැඩ කළ යුතුව තිබෙනවා. එක තමයි ප්‍රමුඛම කාර්යය. අපේ නගර සභාවේ. ඕනෑම රාජ්‍ය

ආයතනයක් හෝ පුද්ගලික ආයතනයක් වාර්ෂිකව ඒ ආයතනයේ දියුණුව , සංවර්ධනය සලකා බලන මිමි තිබෙනවා. රටේ සංවර්ධ ධනය මනින මිම්ම කියනවා භෞතික ජීව දත්ත දර් ශකය කියා. ආර් ථික විද්‍යාව හදාරන ඔය 10 වසරේ ශිෂ්‍යයක් වුණත් දන්නවා. එක ඉහළ යාම පහළ යාම තමයි ජීවන වියදම අඩුවීම පහළ යාම කියන්නේ. මේ රටේ සංවර්ධනය කියන එක ආර්ථිකයේ සංවර්ධනය කියන එක මේ ගරු සභාවේ සංවර්ධනය කියන එක ආර්ථික , සාමාජීය, සංස්කෘතික කියන ත්‍රිත්‍රයේම සංවර්ධනයක් සංවර්ධනය කියන්නේ. අපි එතකොට මේ නගරයේ ජනතාව අපිට ඡන්දය දීලා මේ ගරු සභාවට පත් කර එවලා මේ තත්ත්වය අපෙන් බලාපොරෝත්තු වෙනවා. එයිනුත් බැලුවාම ගණකාධිකාරිතුමිය එකඟ වෙනවා. මේ ආයතනය සේවා සපයන ආයතනයක්. ජනතාවට සේවා සපයන ආයතනයක අපිට බලාපොරෝත්තු වෙන්න බැහැ මහ පරිමාණයෙන් ප්‍රාග්ධන වියදම්. මෙවැනි ආයතන වල වැඩි වශයෙන් ගන්නේ පුනරාවර් තන වියදම්. පුනරාවර් තන වියදම් කියන්නේ ආයතන හා පරිපාලන වියදම්. ආයතන හා පරිපාලන වියදම් කියන්නේ සේවකයන්ගේ වැටුප් තමයි 54% ක් වැඩිම ප්‍රතිශතයක් මෙහි පෙන්වා දී තිබෙන්නේ. එක රජය ප්‍රතිපූර්ණය වෙනවා. මා කතා කරන්න උත්සාහ කරන්නේ ඒ තත්ත්වය එහෙම තියෙද්දි අපි නගර සභාවක් විදියට ස්වයං උත්පාදන වලින් උපයා ගන්නා ආදායම මේ නගරයේ ජනතාවගේ බදු මුදල් වලින් , කුලී මුදල් වලින් උපයා ගන්නා ආදායම නැවත පෙරලා ඒ ජනතාවට අපි දෙනකොට අර ජනතා විමුක්ති පෙරමුණේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කියූ ආකාරයට ඒ අයට අපි නිවැරදිව මේ සුබ සාධන සේවා සපයා දෙනවාද ? නැවත පෙරලා මේ බදු ආදායම එතුමන්ලාට ලබා දෙනවාද කියන ප්‍රශ්නයත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරයෙක් විදියට මට තිබෙනවා. එමනිසා මා මගින් මගටම ප්‍රකාශ කර සිටින්නේ මේ නගර සභාවක් විසින් පුනරාවර් තන වියදම් යටතේ සේවා සැපයිම සඳහා වැඩි ප්‍රතිශතයක් වෙන් කරනු ලැබුවත් සාමාන්‍ය පුද්ගලික ආයතනයක් නම් මෙහි ප්‍රතිශතය 10% ඉක්මවා නොයා යායුතුයි කියන මතය තමයි ගණකාධිකරණයේ තිබෙන්නේ. හැබැයි අපි මේක 50% දක්වා මේ ආයතනය සේවා සපයන ආයතනයක් නිසා 60% දක්වා ඒ තත්ත්වය කළත් අඩුම වශයෙන් 40% ප්‍රාග්ධන සංවර් ධනයක් තියෙන්න ඕන. අර ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරිය ඉදිරිපත් කළා වගේ අවසානයේ ජනතාවට ලැබෙන්නේ සොච්චම නම් මෙහි ප්‍රතිලාභ ගැන අපි කනගාටු විය යුතුයි. රජයක් විදියට මේ ආයතනයෙන් ජල ජාතික නිෂ්පාදනයට රටේ සංවර්ධනය කියන්නේ දළ ජාතික නිෂ්පාදනයයි. එකේ වාර්ෂික වර්ධනය මත තමයි සියළුම බැංකු පොළී රඳා පවතින්නේ. එය 4% නම් 4% ක් තමයි මුළු ලංකාවේම සංවර්ධනය තියෙන්නේ. එතකොට අපේ අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව ගෙන යනු ලබන උත්සාහයට අම්බලන්ගොඩ නගර සභාව විදියට

ඒ දල ජාතික නිෂ්පාදන ආදායමට අපි කතා කරන්න ඕන. අපි දෙන දායකත්වය මොකක්ද ? මේ අයවැය ලේඛණය තුළ එය සපිරිලාද කියන එක මට ප්‍රශ්නයක් තිබෙනවා. මට මේ සංඛ්‍යා ලේඛන අනුව මට කතා කරන්න පුළුවන් . ඕන තරම් පරස්පරතා අඩුපාඩුකම් , ආදායම් බදු විෂමතා , ඊළඟට වරිපනම් බදු හිඟ, කඩ බදු හිඟ , මෙකේම පැහැදිලිව පෙන්වා දී තිබෙනවා. මේවා මහ පරිමාණයෙන් අපිට වාද විවාද කරන්න අවශ්‍ය නැහැ. මා ඉස්සෙල්ලා කතා කළ ආකාරයට නගරයේ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිවෙන්න ඕන. එකට තමයි අපි වැඩිම කොටසක් අපි වෙන් කර තිබෙන්නේ. ඉතිං එකනිසා සේවා සපයන ආයතනයක් නිසා මෙහි පුනරාවර් තන වියදම් 60% කට වැඩියේ යන්න පුළුවන්. අඩුම වශයෙන් 40% ක ප්‍රාග්ධන වියදමක් තිබෙන්න ඕන. එහෙමනම් මේ 40% ක් නැතිනම් මේ නගරයේ මංමාවත් , පාලම්, බොක්කු , ඇළ ,දොළ , පාරවල් මේවා නඩත්තු වෙන්නේ කොහොමද ? මේ නගරය බැලුවාම ඒ අවුරුදු 15කට 10කට පෙර නගරයම තමයි අදත් තිබෙන්නේ. කෝ මේ නගරය පිළිබඳ 2021 සංවර්ධන සැලැස්ම දුන්නාට අඩුම වශයෙන් අවුරුදු 10ක සංවර් ධන සැලැස්මක් කෝ . ඉතිහාසය තුළ තිබුණා. අවුරුදු 10 ක සංවර්ධන සැලැස්ම. අද ගරු සභාපතිතුමනි, 2021 කට සංවර් ධන සැලැස්මක් ඉදිරිපත් කරනවා. බොහොම කනගාටුයි මේක කියවන්නත්. මෙහි කිසිම පරිණතභාවයක් නැහැ. මා කනගාටු වෙනවා මේවා ක්ෂණිකව වීම පිළිබඳව. මොකද ලේකම්තුමියත් , ගණකාධිකාරිතුමියත් මෙය පරිශීලනය කර මෙය ඉදිරිපත් කළානම් හොඳයි කියා හිතනවා. මොකද මේ ගරු සභාවකට මේ ඉදිරිපත් කරන්නේ. මේක ප්‍රවේශමෙන් පරිශීලනය කළහොත් අපිට වේලාවක් වුණේ නැහැ. පිටුවක් දෙකක් මා බැලුවා. මේක බලන්න දෙයක් නැති තරම්. මෙහෙම මේ 2021 සංවර් ධන සැලැස්ම ඉදිරිපත් කළත් , අඩුම වශයෙන් වසර 10 ක වත් මේ නගරයක සැලැස්මක් තියෙන්න ඕන. 2030 වනකොට මේ අලුත් පාර කොහොමද තියෙන් ඕන. ඌරවත්ත පාලම ළඟ සිට අම්බලන්ගොඩ පොලිසිය දක්වා මේ නගරය කෙහොමද තියෙන්න ඕන. වැල්ල පාර කොහොමද තිබෙන්න ඕන. ඔබතුමාම දන්නවා අදටත් විනාඩි 15කින් 10 කින් යන්න බැහැ. අම්බලන්ගොඩ නගරය පසු කරලා. මේවාට සැලසුම් තිබෙන්න ඕන. මේකට තමයි හල්වතුර යෝජනා ක්‍රමය අපි පවරාගෙන තිබෙන්නේ. අක්කර 230 ක් අඩුම වශයෙන් අක්කර 50ක් වත් සංවර් ධනය වි තිබිය යුතුයි අම්බලන්ගොඩ නගරය ඉදිරියට යන්න. මේ සංවර් ධන යෝජනා මේ අයවැයේ නැහැ. කිසිම දෙයක් මෙහි ඉදිරිපත් කර නැහැ. මේකට එදා එක වගේ 2021ට 2020 න් සංඛ්‍යා ලේඛණ ගෙන ඉදිරිපත් කර තිබෙනවා. එකට ගලප්පා තිබෙනවා. එකට මා ගණකාධිකාරිතුමියට හෝ ලේකම්තුමියට දොසක් කියන්නේ නැහැ. මෙය පාලක පක්ෂය විදියට අපි මන්ත්‍රිවරු කණ්ඩායම සාකච්ඡා කරලා සභාපතිතුමා ඇතුළු මේ තීරණය

ගත යුතුව තිබුණා. එහෙම සාකච්ඡාවක් මේකේ මේ එක එක මාතෘකාව යටතේ අපි සාකච්ඡා කරලා වාද කරලා අවසන් තීන්දු වලට මෙහි ඇවිත් නැහැ. එහෙම හදපු අයවැයකෙනුයි මේ නගරයේ ජනතාවට සේවයක් සපයන්න පුළුවන් වෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා අපි 2020.11.17 දින ඔබතුමාත් මේ සාකච්ඡාවට එකතු වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ඔව් ඒ අයවැය කෙටුම්පතට මාත් සහභාගි වුණා. මේක පැය දෙකක් තුනක් ඇතුළත සාකච්ඡා කරන්න පුළුවන් දෙයක් නෙමේ මා කතා කළේ පාලක පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් සාකච්ඡා කරලා මෙහි හර බැර අයින් කරලා අපිට 2021 ට කරන්න පුළුවන් දේවල් මොනවාද ? ඒවායින් ප්‍රායෝගික වෙන්නේ මොනවාද? ඒ පිළිබඳව මීට වඩා ගැඹුරින් සාකච්ඡා කරන්න තිබුණා. මෙකේදි අපි අර මන්ත්‍රීවරු ප්‍රකාශ කළ පරිදි මේ අයවැය යෝජනා යටතේ මේ අවුරුදු 2 ½ ට අයවැය යෝජනා 300කට වැඩියේ ඉදිරිපත් කර තිබෙනවා. මේ අයවැය මේ තුන්වෙනි අයවැය වාර් තාව. මේ සඳහා ගම්මුන්ගේ ප්‍රජා මණ්ඩල කැඳවා , රැස්වීම් කැඳවා අපි යෝජනා අරගෙන තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වෙලාද ? අඩුම වශයෙන් යෝජනා 50ක් ක්‍රියාත්මක වෙලා නැහැ. මා නෙමේ මේක ප්‍රකාශ කරන්නේ. මටත් ප්‍රායෝගිකව කියන්න පුළුවන්. මේ යෝජනා වලින් ක්‍රියාත්මක වු ඒවා මොනවාද ? නැති එවා මොනවාද කියා. මගේ ගම් ප්‍රදේශයේ නම් කියන්න කනගාටුයි. මේවා වේදනාවට කරුණු. අපි ජනතාවගේ ඡන්දෙන් පත්වෙලා මෙතනට එවා තිබෙන්නේ. ඒ ජනතාව පෙරළා බලාපොරෝත්තු වෙනවා මේ ගම්වල අපි සංවර් ධන වැඩකටයුතු කරයි කියා. ඒ මිනිසුන්ගේ පාර හදාවි කියා. ඒ මිනිසුන්ගේ කාණුව. එක කාණුවකට අපි අත තියා නැහැ. ලක්ෂ 20 මගේ යෝජනා යටතේ ඉදිරිපත් කළේ. ජගත් කුමාර මන්ත්‍රීතුමාගේ පනියන්දුවේ. මුළු අම්බලන්ගොඩම කාණු පද්ධතිය 1950 ගණන් වල සිටම පරණයි. වළවල් ළිං තරම් තිබෙනවා. එවා අපිට අයිති නැතු වුණත් ඔබතුමාගේ වගකීම . මේවා ඒ අදාළ ආයතන ලවා සංවර් ධනය කිරිම. ඉතිං මේ නගරයේ ජනතාවට දෙන සංවර්ධනය මොකක්ද? දළ දේශිය නිෂ්පාදනයට රටේ දායකත්වය මොකක්ද ? මෙහෙම ගිහිල්ලා. මේ අයවැය ලේඛණය තුළින් මා දකින්නේ නැහැ එවැනි කිසිදු සංවර්ධන වැඩ පිළිවළක් ඉදිරිපත් කර තිබෙනවා කියා. අනික ගණකාධිකාරිතුමියණනි, ලේකම්තුමියණනි , මේ අයවැය තුළ මා දකින්නේ නැහැ අපේ ප්‍රධාන

ආදායම් මාර් ගයක් තමයි මුද්දර ගාස්තු. දකුණු පළාත් සභාවෙන් ඒ මුද්දර ගාස්තු ලැබෙන කොට එක හිඟය ගැන මා කතා කරන්නේ නැහැ. එය පොතේ පැහැදිලිව පෙනෙනවා. අපිට ලැබෙන්න තිබෙනවා කියා. මට බරපතල ප්‍රශ්නයක් තිබෙනවා ගණකාධිකාරිතුමියණි, දකුණු පළාත් සභාවෙන් විතර ද මේ මුද්දර ගාස්තු අපිට ලැබෙන්නේ. මුළු ලංකාවේම වෙනත් නිතිඥ මහත්ම මහත්මින් ඔප්පු ලියද්දි ඒ මුද්දර ගාස්තු වල ලැබිය යුතු ආදායම පිළිබඳව වෙන වෙනම විශ්ලේෂණයක් මෙහි ලබා දි නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා, ඒ සියළුම ගාස්තු ගෙවන්නේ දකුණු පළාත් සභාව. ඒ කියන්නේ ත්‍රිකුණාමලයේ සිටින නිතිඥ මහත්මයෙක් ඔප්පු ලිව්වාත් ඒ සියළුම ගාස්තු ගෙවන්නේ දකුණු පළාත් සභාව. පළාත් සභාවෙන් තමයි අපිට එවන්නේ. එතකොට වෙන වෙනම මේකක් ඉදිරිපත් වෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එක තමයි දැන් වසරක් පසා එකතු වෙන්නේ නැහැ . මා ඔබතුමාගෙන් ඇහුවොත් අපිට එන්න තිබෙනවා ද කියා. ඔබතුමා දන්නවාද කොයි ආයතනයෙන් කොච්චර එන්න තිබෙනවාද කියා. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුවෙන් අපිට කොච්චර එන්න තිබෙනවාද කියා දන්නවාද ? දන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සියළුම ඒවා අපිට එනවා. අපිට එනවා තක්සේරු වාර්තා. ඒ අනුව අපි පළාත් සභාවෙන් මුදල් ඉල්ලුම් කර ලබා ගන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එක හරි ගිහිල්ලා එකතු කරලා පළාත් සභාවෙන් ගන්නවා. එතකොට මා කතා කළේ එන නොඑන එක නෙමේ. මා කතා කරන්නේ මේ අයවැයේ අපිට පැහැදිලිව පෙන්වා දි නැති එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක මන්ත්‍රීතුමා එහෙම පෙන්වන්න බැහැ. පළාත් සභාවෙන් එන මුදලක් විතරයි එක. ඔබතුමාගේ ඒ වැරදි වැටහිමක්. එහෙම නැතුව කොහේ ලිව්වාත් පළාත් සභාවට තමයි මුදල යන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඔව්. එකතමයි . මේ මුද්දර ගාස්තු වල විශ්ලේෂණය නැහැ කියන එක මා කියන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

විශ්ලේෂණයක් අවශ්‍ය වෙන්නේ නැහැ. එක ගිණුමෙන් එන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අපිට අවශ්‍ය හන්දා තමයි මා මේ කතා කරන්නේ. මේ 2021 අයවැයට අනුව නගර සභාව විසින් ස්වයං උත්පාදන යටතේ ලබා ගන්නා වරිපනම් බදු, කඩ බදු , කුලී බදු වලින් ප්‍රතිශතයක් විදියට බැලුවොත් වැඩි ප්‍රතිශතයක් ආවශ්‍යක සේවා සහ ප්‍රවාහන සේවා සඳහා මෙකේ වියදම් කරන තත්ත්වයක් පෙනෙනවා. එක හොඳ පූර්වාදර්ශයක් නෙමේ. එකෙන් අපි පහළට යායුතුව තිබෙනවා. 2021 අයවැයෙනුත් පෙන්නුම් කරන්නේ එවැනි තත්ත්වයක්. මේ ජනතාවගේ සංවර් ධනය සඳහා තිබෙන මුදල් එවැනි දෙයකින් අඩු කරලා වැඩිපුර එවැනි දෙයකට අඩුම වශයෙන් මේ ප්‍රාග්ධන යම් මට්ටමකට තව වැඩි කර ගැනීමට තිබුණා නම් ඒ ලක්ෂ 12ක් කිවූ මන්ත්‍රීවරුන්ගේ යෝජනා අවම වශයෙන් තව වැඩි කර ගන්න තිබුණා කියන එක මා විශ්වාස කරනවා. එමනිසා මේ අයවැය ගැන මට කතා කිරිමේදි පාලක පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් කනගාටුවෙන් වුණත් මේ අයවැයට විරුද්ධ වෙනවා. මට ප්‍රතික්ෂේප කරන්න සිද්ධ වෙනවා මේ අයවැය. මේක අම්බලන්ගොඩ නගර සභාව ස්ථාපිත වෙනකොට 2017 අපි අලුතින් ස්ථාපිත වෙච්ච නගර සභාවක් නෙමෙයි මේක. 1933 ආඥා පණතින් පිහිටවපු නගර සභාවක් . එතකොට ඒ අනුව අපිට කටයුතු කරන්න තිබෙන්නේ වර් තමාන නගර සභාව පිහිටුවිමේදි ඒ ආඥා පණත් අණ පණත් වලට අනුවයි මේ නගර සභාව කටයුතු කරන්න ඕනේ. මා විශ්වාස කරනවා ඔබතුමා ඒ අනුව කටයුතු කරයි කියා. එමනිසා මා මාගේ විරුද්ධත්වය මෙයින් ප්‍රකාශ කර සිටිනවා . ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් මට සාදාචාරත්මක හේතු තිබෙනවා මාගේ ගමේ ජනතාව වෙනුවෙන් මට ඡන්දය දිලා මා මෙතනට ආපු ජනතාවට මා උත්තර සපයන්න ඕන. වගකීමට මා

බැඳිලා තිබෙනවා. එකනිසා මා කනගාටුවෙන් වුණත් ඉල්ලා සිටිනවා තමුන්නාසේට නැවත වරක් මේ කරුණු සංශෝධනය කරලා හරි මේවා නැවත මේවා කරලා හරි සාධාරණ අයවැයක් ජනතාව අතරට අපිට යාහැකි , ජනතාවට අපිට උත්තර දිය හැකි සාධාරණ අයවැයක් ලබා දෙන ලෙස ඉල්ලමින් මාගේ විරෝධතාවය මා ඔබතුමා වෙත ලිඛිතව ලබා දෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, 1997 සිට මේ සභාව නියෝජනය කරලා වසර 16ක් විතර අයවැය වලට ඉදිරිපත් වු මන්ත්‍රිවරයෙක් වශයෙන් 2021 වර්ෂයේ අයවැයට පාලක පක්ෂය නියෝජනය කරමින් ගරු උප සභාපතිවරයා වශයෙන් මාගේ පක්ෂය වශයෙන් මේ අයවැයට මාගේ පක්ෂපාති බව ප්‍රකාශ කරනවා මුලින්ම. මා මුලින්ම කියන්න ඔනේ මා තනතුරුවලට තනතුරු ලබා ගන්න කාගේවත් මාගේ හිතට එකඟව අනවශ්‍ය විදියට මිනිසුන් උඩ මා එහෙම යන පුද්ගලයෙක් නෙමේ. මා 1997 මේ ගරු සභාව නියෝජනය කළේ ඡන්ද 631 අරගෙන තමයි. 1997 මා මේ සභාව නියෝජනය කළේ. ඒ නියෝජනය කරන කොට මා පත් වුණේ අර එහා කොනේ සිටින අවසාන මන්ත්‍රිවරයා වශයෙන්.මා කියන්න ඕන ඇත්තටම සතුටෙන් මා හැබැයි 2018 මේ මැතිවරණය නියෝජනය කරන කොට 69% ඡන්ද ප්‍රතිශතයක් අරගෙන තමයි වැඩිම ප්‍රතිශතයක් අරගෙන මේ සභාව නියෝජනය කරන මන්ත්‍රිවරයා හැටියට පත් වුණේ. නමුත් අපි දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කරලා පසුගිය කාලෙයේ 2015 ජනවාරි 08 සිට අපිට තිබුණ කරදර අපි දැක්කා. මොනවාද කියා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා එවකට පරාජය වි නිවසට යනකොට 2015 ජනවාරි 08 වෙනිදා අපි එතුමා සමඟ පස්සෙන් ගිහින් අද තමයි මේ සභාව නියෝජනය කරන්න අලුත් පක්ෂයක් හදාගෙන මේ සභාව නියෝජනය කළේ. අම්බලන්ගොඩ කියන්නේ අලුත් පක්ෂයක් හදන්න දායක වු නගරයක් තමයි. විශේෂයෙන්ම කියන්න ඕනේ සමුපකාර ඡන්දය තමයි අපි මහින්දවාදි කියා පක්ෂයක් හදාගෙන ඡන්දය ඉල්ලුවේ. එකේදි අපි වැඩි බලතලත් අරගෙන සභාව පිහිටුවන්න ඒ සමිතිය පිහිටුවන්න වසර 1 ½ වැඩි කාලයක් ගියා. ඒ ගියේ එක්තරා පුද්ගලයෙකු විසින් නඩු මාර් ගයකට ගිහින් දිනාපු සමිතිය පිහිටුවන්න දුන්නේ නැහැ. එහෙම තත්ත්වයක් තිබුණ වකවානුවක දීර් ඝ කාලයක් අපි අර් බුද කරලා මේ 2018 අලුත් පක්ෂයෙන් ඡන්දයට ගිහින් විශාල ජයග්‍රහණයක් ලැබුවා. අපේ ඡන්ද කොට්ඨාශ 12න් අපි 10ක් ජයග්‍රහණය කළා. ඒ 10න් මන්ත්‍රිවරු 10කු මේ සභාව නියෝජනයකරනවා. හැබැයි අපිට අද පත්වෙලා තිබෙන්නේ ඉතාමත් කනගාටුදායක තත්ත්වයක්. එක්සත් ජාතික පක්ෂය 2017 ගෙනාපු මැතිවරණ ක්‍රමය අනුව කොට්ඨාශ 12න් 10 දිනාපු අපිට මන්ත්‍රිවරු 10යි. දිනාපු

කොට්ඨාශ 2කයි. ඒ දෙකට මන්ත්‍රීවරු 11යි. මේ සභාව ගෙනියන්න ඉතාමත් කනගාටුයි. ගෙනියන්න බැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු 11 ඉන්නවා. පාලක පක්ෂයේ කොට්ඨාශ 10ක් දිනා මන්ත්‍රීවරු 10 ඉන්නේ. මෙය ඉතාමත් කැත මැතිවරණ ක්‍රමයකට ගිහිපු මැතිවරණයක්. කොහොම නමුත් අම්බලන්ගොඩ ජනතාව , නගරයේ ජනතාව විශාල ජනවරමක් දී තමයි මේ ගරු සභාව පත්කර තිබෙන්නේ. දිර් ඝ වශයෙන් මා මේ අයවැය ගැන කතා කරන්න යන්නේ නැහැ. මොකද අපි කවුරුත් මේ සභාව නියෝජනය කරලා පාලක පක්ෂයේ , විපක්ෂයේ මන්ත්‍රීවරු 2020.11.17 මේ අයවැය කෙටුම්පත සංශෝධන සහිතව මා හිතන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ වගේම පාලක පක්ෂයේ මන්ත්‍රීවරු මේ කෙටුම්පතට සංශෝධනය කරලා තමයි ගරු සභාපතිතුමනි මේය අනුමත කර තිබුණේ. මේ සභාවේ. ඉතිං මේහෙම මේ අයවැය ලේඛණයේ තිබෙන ඉලක්කම් වලට ගණන් වලට යන්නේ නැහැ. මොකද මේක මිට මාසයකට කලින් මේ කෙටුුම්පත සම්මත කරපු නිසා.එක දිර් ඝ වශයෙන් සාකච්ඡා කරලා තමයි සම්මත කළේ. කියලාම අනිත් ටිකට යන්නම්. මා නැග්ගේ අන්තිම පඩියෙන් . හැබැයි මා කවදා හරි ඔය පුටුවේ වාඩිවෙලා තමයි නතර වෙන්නේ. එක කාටවත් නතර කරන්නත් බැහැ. එක හැබැයි වංචනිකව හින පෙන්නේ ඔබතුම්ලාට තමයි. මොකද හින පෙනිලානේ ඔතනට ආවේ. හැබැයි ඩබල් ගේම් ගහන්නේ නැහැ අපි. නියමානුකුලව යන්න ඕන වේලාවට යන්න ඕන තැනට යයි කියන විශ්වාසය මාගේ තිබෙනවා. එමනිසා මා වැඩියේ කලබල වෙන පුද්ගලයෙක් නෙමේ. මා අවේ පහල පුටුවේ සිට. උඩ පුටුවටත් ඇවිත් තිබෙනවා. ඊළඟ පුටුවටත් යන්න වැඩි කාලයක් යන්නේ නැහැ. මතක තියා ගන්න. අයිරාංගනී මන්ත්‍රීතුමිය දිගින් දිගටම කතා කර කිවුවා මා පදිංචි වි සිටින කොට්ඨාශයේ වැඩක් කෙරෙන්නේ නැහැ කියා. ගරු සභාපතිතුමනි, පදිංචිවෙලා ඉන්න එපැයි වැඩක් කෙරෙන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා අයිරාංගනී මන්ත්‍රීතුමියට ළිදක් හදන්න අපේ මන්ත්රිතුමාට ඉස්සෙල්ලා මුදල් දුන්නා. තාම එම ළිඳේ භාගේට වැඩ. මුදල් දිලා ලක්ෂ 20 ගණනක්.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එවා පෙන්නේ නැතුව. එතුමිය පදිංචිය නැතුව. දැන් අද උදේත් සභාවට ආවේ මොරටුව ප්‍රදේශයේ ඉඳලා. එමනිසා අපි ඒ ගැන කලබල වෙන්න ඕන නැහැ. මොකද එතුමිය මොරටුව ප්‍රදේශයේ පදිංචිවෙලා ඉන්නේ. එතකොට ගමේ ප්‍රදේශයේ කෙරෙන වැඩක් දන්නේ නැහැ. හැබැයි අපි කනගාටු වෙනවා දිර් ඝ වශයෙන් මේ හැම කොට්ඨාශයකටම අපි වැඩක් කර

තිබෙනවා. අපි වැඩ කර තිබෙනවා. මොකද පත්වූ මන්ත්‍රීවරයා කියා මා කවදාවත් එහෙම ප්‍රකාශ කරලා නැහැ. විපක්ෂ මන්ත්‍රීවරුන්ට වැඩ කරලා තිබෙනවා සභාපතිතුමා අපිට වඩා. විශේෂයෙන්ම කියන්න ඕනේ. මේ වෙනකොටත් අතුල මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ වැඩක් කරනවා. මා දන්නේ නැහැ සභාපතිතුමා ඒවා අපිටත් හොරා දුන්නේ. හැබැයි සභාපතිතුමාට වර් ණා කරලා තමයි දුන්නේ. සටන් කරලා හරි කොහොම හරි ගත්තානේ. අපිට කළේ නැහැ. එමනිසා දිර්ඝ වශයෙන් හැමෝටම වැඩ කරලා තිබෙනවා. එක නැහැ කියන්න බැහැ කාටවත්. විශේෂයෙන් අතුල මන්ත්‍රීතුමාට කියන්න ඕනේ. අපිත් 2015 සිට අපිත් විපක්ෂයේ හිටියා. ඒ දවස් වල ආවා ගම්පෙරළිය කියා වැඩ සටහනක්. එහි ගමේ සිටින අපේ කාටවත් නෙමේ එක්සත් ජාතික පක්ෂයේ ගමේ සිටින ඒ සමිතියේ පුද්ගලයා තමයි මේ වැඩ කළේ. අපිට වැඩ කළේ නැහැ. මේ සභාවේ මට මගේ කතාව කරන්න දෙන්න. ගම්පෙරළිය අවුරුදු ගාණක් කළා. කාටවත් එය අපේ මන්ත්‍රීවරුන්ට දුන්නේ නැහැ. හැබැයි අපි සපිරි ගමක් වැඩ සටහන යටතේ කිසිම භේදයක් මන්ත්‍රීවරු එක්සත් ජාතික පක්ෂයේද ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද කියා බැලුවේ නැහැ. ඒ ලක්ෂ 20 දුන්නේ ඒ ජනතාවට වැඩ කරන්න. විශේෂයෙන්ම කියන්න ඕනේ අපේ කාපට් ව්‍යාපෘතිය යටතේ අපි ආරම්භ කළේ අපේ සහෝදර මන්ත්‍රී සෝභිත මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයෙන් තමයි අපි වැඩ ආරම්භ කළේ. එතුමා තමයි මුලින්ම වැඩය පටන් ගත්තේ. අපි එහෙම වැඩ කළේ. එහෙම තමයි අපි වැඩ කරන්නේ. අපි මේ පක්ෂයක් බදාගෙන වැඩ කළේ නැහැ. මේ මන්ත්‍රීවරු දිර් ඝ වශයෙන් කිවුවේ . මා හරි කනගාටු වෙනවා. අවුරුදු ගාණක් සභාපතිතුමා වර් ණා කරලා කරලා මේ වසරේම මේ පණතේ තිබෙන තැනක් අරගෙන මේ අය මේ අයවැය පරාජය කරන්න බෙදිමක් ඉල්ලනවා. එමනිසා ගරු සභාපතිතුමනි, අපි කනගාටු වෙනවා. ඒ වගේම සමහර මන්ත්‍රීවරු ඉන්නවා තමන්ගේ කොන්ද තිබෙනවා කියා සභාවේ දෙපාර තුන්පාර ප්‍රකාශ කරනවා. දෙපාර තුන් පාර කියනවා මට හොඳ කොන්දක් තිබෙනවා කියා. කොන්ද තිබෙන මන්ත්‍රීවරු මේ සභාවේ ඉන්නවාද කියන ඉතාමත් කනගාටුයි දැන ගන්න. අපේ නිලානි මන්ත්‍රීතුමිය කියනවා කළමනාකරණ කමිටුවට එතුමිය කැඳවන්නේ නැහැ කියා. කළමනාකරණ කමිටුව කියන්නේ ගරු සභාපතිතුමා ඇතුළු ලේකම්තුමිය , නිලධාරි මණ්ඩලයක් සහභාගි වෙන කමිටුවක්. එකවත් එතුමිය දන්නේ නැතුව තමයි ඒතුමිය ඒ ප්‍රකාශය කළේ. නගර සභවේ මන්ත්‍රීවරියක් වශයෙන් මේ වගේ ප්‍රකාශ කිරිම ගැන ඉතාමත් කනගාටු වෙනවා. බොක්කුවක් හදන්න මුදල් දුන්නේ. මෙහෙම කතා කරන්න ලැජ්ජා නැතුවද මන් දන්නේ නැහැ. තමන්ගේ ගේ ගාවින් හෝටලය ළඟ බෝක්කුව තමයි දැනුත් හදන්නේ. මේ නගර සභාවේ මුදල් අරගෙන ගිහින්. දැනුත් කරන්නේ

සභාවේ මුදල් අරගෙන ගිහින් තමුන්ගේ බෝක්කුව හදන එක. ලැජ්ජා නැතුව කතා කරන්න එපා. අපි කතා කරන කොට මේ අයට හිරි එනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

ධම්මකුසල විද්‍යාලය අදටත් වහලා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

කවුද දන්නේ නැහැ වැහුවේ. සමහර මන්ත්‍රීවරු කියනවා මේ සභාවේ ඉලක්කම් විජ්ජාවක්ලු තිබෙන්නේ. විජ්ජාවක් නම් 2020.11.17 වන දින මෙය සම්මත කරන කොට මේ කමිටු සාකච්ඡා කරලා කමිටුව සම්මත කරන කෙට මේක දැක්කේ නැද්ද? දැන් ද කියන්නේ. මේ සභාවේ. තනිකර කුමන්ත්‍රණයක් ගෙනියන්නේ. එමනිසා මේවාට උත්තර දේනන ගියොත් ලොකු කාලයක් යනවා. අපි කියන්න ඕනේ අපේ චම්පා මන්ත්‍රීතුමිය ප්‍රකාශයක් කළා . ප්‍රදේශයේ ජනතාවට ලක්ෂ 12ක වගේ කොටසක් තමයි කොට්ඨාශයකට ලැබෙන්නේ කියා. අපි සභාපතිතුමා අපි ඒ ලක්ෂ 12 වෙන්කර තිබෙන්නේ අයවැයෙන් අපිට වෙන් කරන්න පුළුවන් ප්‍රමාණය. කොට්ඨාශ 13 ට ලක්ෂ 12 ගණනේ වෙන් කර තිබෙනවා. හැබැයි අපි ඒ එක වැඩක් නෙමේ . අවුරුදු ගණනට යම්කිසි වැඩ කොටසක් අපේ රජයෙන් ලැබෙන මුදලුත් එක්ක යම්කිසි වැඩ කොටසක් කරනවා. අපිට යම්කිසි කොටසක් වැඩ කරනවා. අපිට තිබුණා මේ අයවැය යෝජනාවේ ලක්ෂ 50 ක් විතර දමා එතුමිය කියනවා වගේ ඉල්ලක්කම් ගොඩක් දමා පෙන්වන්න. එහෙම කරන්න බැරි නිසා තමයි මේ ලක්ෂ 12 වෙන්කළේ. හැබැයි අපි සභාවට ලැබෙන මුදල් අනුව අපි සභාවේ යම්කිසි යෝජනා අරගෙන වැඩ කරනවා. සභාවේ ආදායම කෝටියකට වඩා මුදලක් අඩු වෙලා තිබෙනවා. නගර සභාවේ ආදායම කෝටියක අඩු ප්‍රමාණයක්. මේ මුදල් ලැබුණේ නැහැ. කොවිඩ් නිසා මේ මුදල් ලැබුණේ නැහැ. මේ මුදල් ලැබුණා නම් අපිට සභාවේ යම්කිසි වැඩ කොටසක් කරන්න තිබුණා. හැබැයි අපි ඊට වඩා වැඩ කොටසක් අම්බලන්ගොඩ නගර සභාවේ මේ කොවිඩ් වසංගතය නිසා කළා. අපි දන්නවා ජනතාවගේ සෞඛ්‍ය පැත්තෙන් කොච්චර වියදම් කරනවාද කියා. මන්ත්‍රීවරු හිතට එකඟවද දන්නේ නැහැ කතා කරන්නේ. මේ මන්ත්‍රීවරු පැමිණ තමයි මේවා දෙන්න . මේවා දෙන්න කියා කමිටු වල ඇවිත් කතා කරලා කිවුවේ. ඒ නිස තමයි මේවා ජනතාවට ලබා දුන්නේ. ඔය කවුරු කතා කළත් අපි දන්නවානේ 2002 සිට 2004 වෙනකම් ආණ්ඩුවක් තිබුණානේ. මේ මන්ත්‍රීවරු මන්ත්‍රීවරියන් නියෝජනය කර අයත් සිටියානේ. හොඳ ඇමතිකම් 4කුත් ගත්තානේ. අර වැව් 10000කුත් දුන්නානේ. හැදුවානේ වැව් 10000ක් . එක වැව් 1000ක් වත් නැහැ. වැව් 10000ක් හැදුවා නම් අද ලංකාව ස්වයං

පෝෂිතයි. අද මොනවාද කියන්නේ. අද වැව් 10000ක් හැදුවා නම් රු.50ට නෙමේ රු.25ටත් හාල් දෙන්න පුළුවන්. ඒ වැව් හැදුවා නම් . ඔබතුමාගේ ආණ්ඩුව කාලේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුත් අරගෙන හොඳම ඇමතිවරු 4කුත් අරගෙන දුන්නේ.අන්න වැඩ පෙන්නවානේ පෙන්වන්න ඕන. හොඳට වැඩ පෙන්වන්න තිබුණා ඒ කාලයේ . එහෙනම් කරන්න තිබුණා. ඒ කතා කරනවා ඇවිත් මෙතන ඕවට කියන්න ඕන. මට දීර්ඝ වශයෙන් කතා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපි අම්බලන්ගොඩ නගර සභාව කියන්නේ ලංකාව ප්‍රදේශයේ ඕන කෙනෙක් ඉපදෙනවා නම් මරණය දක්වා සාමාන්‍යයෙන් ඒ පුද්ගලයා වෙනුවෙන් යම්කිසි සේවයක් කරන්න බැඳී සිටිනවා පළාත් පාලන ආයතනයක්. අපි විශේෂයෙන් කියන්න ඕන. අම්බලන්ගොඩ නගර සභාවේ මෙන්න මේ ඉපදෙන පුද්ගලයා ඉපදිලා මරණය දක්වා යනකම් යම්කිසි පළාත් පාලන ආයතනයක් වැඩක් කරනවා නම් වැඩක් කරන්නේ අම්බලන්ගොඩ නගර සභාව විතරයි. ඒ පුද්ගලයා මොකද අපි දන්නවා මේ අම්බලන්ගොඩ නගරයේ ළමයෙක් ඉපදුනා නම් ඔබතුමාගේ සංකල්පයක් අනුව මේ ඉපදෙන ළමයාටත් යම්කිසි වැඩ කොටසක් කරනවා. ඒ මනුස්සයා මැරුණානම් ඒ මැරුණු පුද්ගලයාට අම්බලන්ගොඩ නගර සභාවෙන් යම්කිසි වැඩ කොටසක් කරනවා. මා දකින්නේ නැහැ. ලංකාවේ කොහේවත් මේ අම්බලන්ගොඩ නගර සභාව විතර ඒ ඉපදෙන පුද්ගලයා සිට මැරෙන අවස්ථාව දක්වා මෙන්න මේ වගේ අම්බලන්ගොඩ නගර සභාව වගේ සේවයක් කරන ආයතනයක්. මේ නගර සභාව වගේ නැහැ කියන එක. එක මා කියනවා . මේ මෑත ඉතිහාසයේ මේ මෑතකදී ළමයා ඉපදෙන මොහොතේ ගැබිනි මවුවරුන්ට බඩු මල්ලක් ලබා දෙන්න තීරණය කළා. ඒ හැඟීම තිබෙනවා. මා කනගාටු වෙනවා ඇත්තටම පාලක පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලෙස අපිත් එක්ක ජයග්‍රහනය කරලා අපිත් එක්ක කටු කා ගෙන අපේ සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා මේ අයවැයට විරුද්ධ වීම සම්බන්ධව. මොකද එතුමා අවුරුදු ගාණක් එකට ඉඳලා හොඳ අත්දැකීම් තිබෙන මන්ත්‍රීවරයෙක්. නමුත් මා දන්නේ නැහැ එතුමා මොනවගේ හේතුවක් නිසා මෙයට විරුද්ධ වුණාද කියා. එහෙනම් මා ඕනේ මුලින් මේ අයවැයට විරුද්ධ වෙන්න. මට එහෙම ගැටළුවක් මට මේ තනතුරට ආශාවක් තිබෙනවා නම් මාගේ ඡන්දය මා විරුද්ධව දෙන්න ඕන. අපි ඒ විදියට යන්නේ නැහැ. අපි මේ පක්ෂය හදන්න , මේ පක්ෂය මේ විදියට ගෙන්න මුල සිටම දහඩිය මහන්සියෙන් කටයුතු කර පුද්ගලයින් හැටියට අපේ පක්ෂය ගත් තින්දු කිසි දෙයක් පවා දෙන්න අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒ වගේම ගරු අග්‍රමත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ ගෙන යන වැඩිපිළිවල වෙනුවෙන් අපේ සම්පූර්ණ කැප කිරිම කරලා මේ සභාවේ සියළු වැඩ කොටස් කරන්නට අපි මේ ඉන්නේ. අපිට තව මාස 15ක 16ක කාලයක් අපේ පාලනය තිබෙන්නේ. නමුත් අපේ රජයක් අපේ පාලන කාලයක් අපේ

ජනාධිපති කෙනෙක් අපේ  අගමැති කෙනෙක් මේ රටේ ඉන්නේ. එමනිසා අපිට විශාල වැඩ කොටසක් අපේ රට වෙනුවෙන් අපේ ජනතාව වෙනුවෙන් අපි පත්කර එවපු මේ ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරන්න තිබෙනවා. තව එකක් අපි බෙදිලා ගියොත් එහෙම මේ වගේ වැඩ කොටසක් කරන්න තිබෙන අවස්ථාවක අපි කිසිසෙත්ම අපේ පාලක පක්ෂයේ අයවැය යෝජනාවක් පරාජය කරන්න අපි කිසිසේත්ම බලාපොරොත්තු වෙන්නේ නැහැ. මාගේ සහායෝගය ලබා දෙනවා. මොකද අපි පක්ෂයේ ප්‍රතිපත්ති ගරුක මන්ත්‍රිවරු වශයෙන් අපිට කරන්න පුළුවන් සේවය කරන්න අපි බැදි ඉන්නවා. මගේ පක්ෂය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අපිට ලබා දුන් උපදෙස් අනුව අපි කටයුතු කරනවා. කවදාවත් මේ පක්ෂය ගත් තින්දු කඩ කරන්න අපි එකග වෙන්නේ නැහැ. කරන්නෙත් නැහැ කියන ප්‍රකාශය කරමින් මාගේ මන්ත්‍රිවරු සභාපතිවරයා වශයෙන් අපේ මන්ත්‍රිවරු අපේ පක්ෂයේ සියළුම මන්ත්‍රිවරු විරුද්ධ වෙනවා කියා කතා කළා. එක මන්ත්‍රිවරයෙක් හැර අපි ඒ මන්ත්‍රිවරයාගෙන් ඉල්ලිමක් කරනවා. මේ වගේ තින්දුවකට යන්න එපා. මොකද ඒ වගේ තින්දුවකට ගියොත් අපි කරගෙන ආපු සභාපතිවරයාගේ යම් යම් අඩුපාඩු තිබුණොත් අපිට සමතයකට කර ගැනීමට අපට අවස්ථාව තිබෙනවා. එමනිසා අපි එතුමාගෙන් ඉල්ලිමක් කරනවා එතුමා ඒ කළ ප්‍රකාශය අපිට ඡන්දය ප්‍රකාශ කිරිමේදි අපිට ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. මේ සභාව මේ අයවැය පැරදුනොත් යම්කිසි තනතුරු වලට යන්න බලාපොරොත්තු තිබෙනවා නම් මා හිතන්නේ එය කිසිසේත්ම සිද්ධ වෙන්නේ නැහැ. මොකද මේ පණතේ ප්‍රකාරව පැහැදිලිව කියා තිබෙනවා. මා හිතන්නේ සභාපතිතුමා එය ප්‍රකාශ කරයි. නැතිනම් මට වුණත් ප්‍රකාශ කරන්න පුළුවන්. ප්‍රකාශ කරලා තිබෙනවා. එමනිසා මා හිතන්නේ නැහැ එහෙම සිද්ධියක් වෙයි කියා. ඒ වුණත් අපි කවදාවත් අම්බලන්ගොඩ ජනතාව දිපු ජනතාව 2018 දිපු මේ ජනවරම ඒ ජනවරමට පයින් නොගහන බව ප්‍රකාශ කරමින් මාගේ සහායෝගය මෙයට ලබා දෙනවා කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සියළු මන්ත්‍රිවරුන් අයවැය සැදිම සඳහා දිපු සහායෝගය සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රිවරුන්ට සභාපතිවරයා වශයෙන් මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. සභාපතිවරයා වශයෙන් අයවැය සැදිමේදි ගතයුතු පියවර වශයෙන් මා ගතයුතු පියවර කෙසේ වුණත් මා මන්ත්‍රිවරුන්ගේ සියළු දෙනාගේම සාකච්ඡාව ගත්තාම සරත් චන්ද්‍ර මන්ත්‍රිතුමා කරපු ප්‍රකාශයේ තිබෙන්නේ පෙර කරපු වැඩ සම්බන්ධයෙන් විවේචනයක් තිබ්බා.  අයිරාංගනී මහත්මියටත් පෙර කරපු විවේචනයක් තිබ්බා. අතුල මන්ත්‍රිතුමාටත් සභා වාර්තා පෙර කරපු විවේචනයක් තිබුණා.

නිලානි මන්ත්‍රීතුමියටත් පෙර කරපු වැඩ පිළිබඳ විවේචනයක් තිබුණා. රාහුල මන්ත්‍රීතුමාටත් සභා වර්තා කොළ සම්බන්ධ වරදක් එක වරදක් ළිං 28 ක් කියන එක 18ක් කියා සංශෝධනය වෙන්න ඕන කියා ඉල්ලිමක් කළා. නැහැ විය යුතුයි කියා සඳහනක් කළා. ඒ හැර වෙන දෙයක් නැහැ. ඒ වගේම විදුලිය හා පරිසර ගිණුම් අක්‍රයයි කියා ඔබතුමා ආයේ විගණන වාර්තාවේ තිබෙනවා කියා කිවුවා. විදුලිය කියන ශිර්ෂය 1979 ලංකාවේ අම්බලන්ගොඩ නගර සභාවෙන් ඉවත් වුණේ. 1979 තිබුණ මේක තාම අද වෙනතුරුම තිබෙනවා. අක්‍රිය තමයි. පරිසර කියන එකක් අක්‍රියයි. ඒ බලතල සියල්ල අමාත්‍යාංශ අරගෙන තිබෙනවා. එමනිසා අක්‍රිය වෙලා තිබෙනවා. අද ඊයේ නෙමේ . 1979 සිට අක්‍රිය වෙලා තිබෙන්නේ. අක්‍රියයි එක. එය හැම වාර්තාවේම තිබෙනවා. ඒ වගේම අපේ චම්පා මන්ත්‍රීතුමිය ස්වයං උත්පාදන වැඩ සටහන් මෙහි අන්තර්ගත වෙලා තිබෙනවාද කියා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අම්බලන්ගොඩ නගර සභාව ස්වයං උත්පාදන වැඩ සටහන් යටතේ තමයි මේ විදියට හරි රැකිලා තිබෙන්නේ. අම්බලන්ගොඩ නගර සභාව කියන්නේ කඩ සාප්පු 199ක් අද වෙනකොට අයිති නගර සභාවක්. අද වරිපණම් ගෙවන අපේ අය ගෙවන්නේ ලක්ෂ 20යි . අද වෙනකොට  අපි කුණු අදින්න විතරක්  හාරකෝටි හාර ලක්ෂයක් වියදම් කරනවා. මේ අම්බලන්ගොඩ නගර සභාව වියදම් කරනවා. ඒ අනුව විශාල මුදලක් අපි කසළ බැහැර කරනවා. ඇත්ත වශයෙන්ම සෑම වැසියෙක්ම මන්ත්‍රීතුමිය කියන්න ඕන අම්බලන්ගොඩ නගර සභාවට ණය මිසක කවදාවත් නගර සභාවට වැඩියෙන් ගෙවා වැඩියෙන් අපේක්ෂා කරපු මිනිසුන් නැහැ. මොකද හරිවිදියට වරිපණම් ගෙවුවේ ලක්ෂ 20 ද  ලක්ෂ 20ට තමයි වැඩ කොටස් කරන්න පුළුවන්. නමුත් ඒ වගේ අපේ වැඩ කොටස් කර ගන්න පුළුවන්. අපි සෞඛ්‍ය වෙනුවෙන් හාර කෝටි හාර ලක්ෂයක් වියදම් කරනවා. ඒ වගේම අපි ක්‍රිඩාංගණය හදලා ඉවරයි. ඒ වගේම අපි කිසිම කොන්ත්‍රාත් එකක් නොදී අද අපේ නගර සභා කාර්යාලය කඩා දමන්න කියා තිබුණ මේක නැවත ගොඩ නගලා 75% ක් විතර අවසන්. මේ මන්ත්‍රීවරු සියළු දෙනාටම මා කියන්න ඕන ඒ වගේම අතුල මන්ත්‍රීතුමාට ආපු ගමන්ම අපි එතුමාගේ කොට්ඨාශයේ අපි බෝක්කුවක් හැදුවා ලක්ෂ 25කට වැඩි ගණක් වියදම් කරලා. ඒ වගේම දැනට අපේ කාපට් ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙනවා. ඒ කාපට් ව්‍යාපෘතියේ සම්පූර්ණ වියදම මිලියන 260ක් . පාරවල් 16 දැනට පලවෙනි එකේ මේවා වෙනවා. ඊට පස්සේත් තව පාරවල් ගණනක් එනවා. ඒ පාරවල් ගණන එන එකේ අපි පලවෙනි එක සෝභිත මන්ත්‍රීතුමාගේ කළා. ඒ වගේම අතුල මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ විශාල පාරක් ඇත්ත වශයෙන්ම කුලරත්න යන පාර සම්පූර්ණයෙන්ම කාපට් කරලා ඒ වගේම බුද්ධ දත්ත මාවතෙන් එළියට ඇවිත් යන පාරක් නම් කරලා තිබෙනවා. එක මේ මාසය ඇතුළත කර අවසන් වෙනවා. ඉතිං එවැනි ආකාරයෙන් නිලානි

මන්ත්‍රීතුමියගේ හෝටලය අසළ ඒ හෝටලය එතුමියගේ මල්ලිගේ හරි අයියාගේ හෝටලයේ බෝක්කුව හදන්න දැන් ලක්ෂ 30ක් විතර දීලා තිබෙනවා. ඔබතුමියට මතක ඇති ඔබතුමිය පැමිණ එක්තරා දිනයක කිවුවා අපේ ගමේ මල ගෙයක් තිබෙනවා. මල ගෙදරට මරණය ගෙනියන්න විදියක් නැහැ කියා ඒ වේලාවේම ABC 6ක් දමා මා ඒ වැඩය කර දුන්නා. ඉතිං අපි විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ කියා නැහැ. විශේෂයෙන් අයිරාංගනී මන්ත්‍රීතුමියටත් කියන්න ඕන. අයිරාංගනී මන්ත්‍රීතුමිය ඉන්නේ නගර සභා නිවාසයක හිටියේ. ඒ ඔප්පු ලබා දීමේදි අපි එතුමියට මේවා කරන්නේ නැතුව අපි එතුමියගේ නායකතුමා ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ ඉල්ලිම පරිදි අපි ඔබතුමියටත් එක කර දුන්නා. වෙන කතන්දර රාශියක් තිබෙනවා. එළිපිට කිවුවොත් සමහරුන්ට ඇඳුම් ඇඳගෙන ඉන්න බැරි වෙනවා. ඒවා මා ප්‍රකාශ කරන්නේ නැහැ ඇත්ත වශයෙන්ම . නමුත් අපි උදවු කර තිබෙනවා සියළුම මන්ත්‍රීවරුන්ට . මන්ත්‍රීවරුන්ට කිසිම මෙකකින් තොරව උදවු කර තිබෙනවා. හැම එක්කෙනාටම උදවු කර තිබෙනවා. ඒ වගේම මේ සියල්ලටම පිළිතුරු දෙන්න මේ සියළු දෙනාටම අපි අයවැය සම්බන්ධයෙන් මීට ඉස්සරවෙලා කෙටුම්පතක් තිබ්බා. 2020.11.17ට මේ කෙටුම්පතට සම්බන්ධ වෙලා තිබෙනවා. මෙතන සිටින සියළු මන්ත්‍රීවරු කමල් වැල්ලගේ , සරත් ශ්‍රී ලාල් , ජගත් කුමාර , ශ්‍රේෂන් කෙරමිණිය , ලක්ෂ්මි හේමන්තා , ධර්මදාස මහතා , ධම්මික කොඩිකාර මහතා , නන්දන රාජපක්ෂ , ලසන්ත අජිත් කුමාර , සෝභිත රංජිත් ,අතුල ප්‍රියන්ත ,ඉනෝකා ක්‍රිශාන්ති, රාහුල ලලිත වික්‍රම, නිලානි, ,සරත් චන්ද්‍ර මැතිතුමා , චම්පා සුමුදු කුමාරි මහත්මිය ඇතුළු සියළු මන්ත්‍රීවරු සහභාගී වෙලා තිබෙනවා. එදා ඉදිරිපත් කරපු සංශෝධන සියල්ලටම අපි එකඟ වෙලා තිබෙනවා. ඒ අනුව නගර සභා ආඥා පණතේ තමුන්නාසේලාට මා කියන්න ඕන අයවැය ලේඛණයක් ඉදිරිපත් කිරිම කියන එක සඳහන් කර තිබෙන්නේ 178 ( 1 ) කියනවා සෑම නගර සභාවකම නගර සභාපතිවරයා විසින් එක් එක් වර්ෂයක් තුළ කොමසාරිස් වරයා විසින් නියම කරනු හැකි අකෘතියෙන් යුක්ත වුද (අ) නිසිපරිදි ශීර්ෂ යටතේ විෂය අංක යටතේ පිළියෙල කිරිමට යෝජිත වියදම් පිළිබඳ විස්තරයක් (ආ) වරිපණම් බදු නොවන ප්‍රභයන් කොටස සභාවට ලැබෙන ආදායම් වල ඇස්තමේන්තුවක් (ඇ) යෝජිත වියදම් සඳහා විධිවිධාන සැලැස්විමේ කාර්යය සඳහා අවශ්‍ය වරිපනම් බදුවල ඇස්තමේන්තුවක් ඇතුළත් වුද , ඊළඟ අනුපාප්ති වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයක් සභාවේ අතුරු ව්‍යවස්ථාවලින් හෝ 193 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලින් නියම කරනු ලැබ ඇති දිනයේ දී හෝ ඊට පෙර පිළියෙල කොට සභාවට ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව සභාවේ කෙටුම්පතක් වශයෙන් 2020.11.17 ඉදිරිපත් කර තිබෙනවා. ඒ කෙටුම්පතේ සියළු විපක්ෂ මන්ත්‍රීවරුන් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් අපේ පක්ෂ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ලද සියළු

සංශෝධන පිළි අරගෙන ඒ සංශෝධන ඇතුළත්ව තමයි අද මෙය කර තිබෙන්නේ. ඒ අනුව අද දිනයේදි කිසිම මන්ත්‍රිවරයෙක් තමන්. ඔයා වාඩිවෙන්න. මගේ අවස්ථාව මේක. එහෙම වෙන්න බැහැනේ. ඔයාගේ කතාව ඉවරයි. වාඩිවෙන්න. ඔයාගේ කතාව ඉවරයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , වාඩිවෙන්න කියන්න. සභාපතිතුමාගේ ප්‍රකාශය කරන්න වාඩිවෙන්න කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා වැදගත් නිතිඥ මහතෙක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මගේ කතාව කරන්න දෙන්න. මන්ත්‍රිතුමා වාඩි වෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙක වලංගු වෙන්නේ නැහැ. 178 .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මාගේ කතාවේදි බාධා කරන්න බැහැ. මේ අවස්ථාවේදි සියළු මන්ත්‍රිවරු මෙම අයවැය අපි ඉදිරිපත් කර තිබෙනවා. සියළු සංශෝධන වලට එකඟ වෙලා. ඒ අනුව 178(අ) අනුව මේ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයක සියලුම විෂයන් හෝ ඉන් යම් විෂයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඊට යම් විෂයයක් එක් කරනු ලැබුවහොත් , සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවන්නේ නම් , ඔහු විසින් එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයට තව දුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතු බවත් ඒ අනුව අයවැය ලේඛණය ඉදිරිපත් කර සංශෝධන පිළිගෙන ඇති බැවින් අයවැය සභා සම්මත කළා සේ සලකා

සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව තමුන්නාසේලාට අයවැය ලේඛණය ඉදිරිපත් කරලා සංශෝධන අපි පිළිඅරගෙන ඇති බැවින් අයවැයක් සභා සම්මත කලා සේ සලකනවා. සභාවේ වැඩ කටයුතු අවසන්.

**තීරණය -**

2021 වර්ෂයට අදාල අයවැය සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කළ අතර අයවැයට පක්ෂව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා,ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා,ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි හේමන්තා මෙනවිය,ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා අදහස් දැක්වූ අතර, අයවැයට විරුද්ධව ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා අදහස් දැක්විය. ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රි අතුල ප්‍රියන්ත මහතා , ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම් නිලානි මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රි චම්පා සුමුදු කුමාරි මහත්මිය , අයවැය ප්‍රතික්ෂේප කර බෙදීමක් ලබා දෙන ලෙස අදහස් දක්වන ලදී. ගරු නගර සභා මන්ත්‍රි ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මාදුවගේ මහතා හැර අනිත් සියළු ගරු මන්ත්‍රිවරුන්ගේ සහභාගිත්වයෙන් 2020.11.17 දින අයවැය කෙටුම්පත් සාකච්ඡාවක් තිබු බවත් එහිදි ඉදිරිපත් කර ඇති සියළු සංශෝධනයන්ට එකඟව ඇති බැවිනුත් නගර සභා ආඥා පණතේ 178 (1) අනුව සෑම නගර සභාවකම සභාපතිවරයා විසින් එක් එක් වර්ෂයක් තුළ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි අකෘතියෙන් යුක්ත වුද ( අ ) නිසි අය ශිර්ෂ යටතේ විෂයාංක සහිතව පිළියළ කළ යෝජිත වියදම් පිළිබඳ විස්තර ( ආ ) වරිපනම් බදු නොවන ප්‍රභයන්ගෙන් සභාවට ලැබෙන ආදායම් පිළිබඳ ඇස්තමේන්තුවක් ( ඇ ) යෝජිත වියදම් සඳහා විධිවිධාන සැලැස්වීමේ කාර්යය සඳහා අවශ්‍ය වරිපනම් බදු වල හෝ බදු වල ඇස්තමේන්තුවක් ඇතුළත් වුද ඊළඟ අනුපාප්ති වර්ෂය සඳහා වු අයවැය ලේඛණයක් සභාවේ අතුරු ව්‍යවස්ථා වලින් හෝ 193වන වගන්තිය යටතේ සාදන ලද රිති වලින් නියම කරනු ලැබ ඇති දිනයේදි හෝ ඊට පෙර පිළියළ කොට සභාවට ඉදිරිපත් කළ යුතු බවත් ඒ අනුව සභාවේ කෙටුම්පතක් වශයෙන් 2020.11.17 ඉදිරිපත් කළ බැවින් හා එහිදි

විපක්ෂ මන්ත්‍රීවරුන් සහ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ලද සියළුම සංශෝධන වලට එකඟ වූ බැවින් නගර සභා ආඥා පණතේ 178(අ) අනුව මේ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයක සියලුම විෂයන් හෝ ඉන් යම් විෂයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඊට යම් විෂයයක් එක් කරනු ලැබුවහොත් , සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවන්නේ නම් , ඔහු විසින් එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයට තව දුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතු බවත් ඒ අනුව අයවැය ලේඛණය ඉදිරිපත් කර සංශෝධන පිළිගෙන ඇති බැවින් අයවැය සභා සම්මත කළා සේ සලකා සභාවේ වැඩ කටයුතු අවසන් කරන බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පෙරවරු 11.50 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරනවා.

ඩබ්.ඩී.ආර්.ජේ.රුද්‍රිගු මිය                                        අරුණ ප්‍රදීප් මණිමෙල්වඩු

ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2020.12.28

වන දින
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදි.